ඉටි සකුව

පාළිය ද සමඟ යැ

කුමාරතුංග මුනිදාසයන්
විසිනි

හඟවූව

මහලු දිවැ බොහෝ දෙන සකුව උගන්නට යැ යි කල් මරති. එ සේ ද කොටැ, කෙළවර දී තමන් දන්නා සකුවක් නැති බව දැනැ තැවෙත්. වරද උගන්වන්නවුන් අතෙහි යැ.

උගන්නට අමාරු බසෙක් නො වේ සකුව මේ නියරින් ඉගෙනැ බලන්නැ. මෙයට වැඩි කලෙක් යන්නේ ද නො වේ. දවසකට එක් පැදුම ගණනේ උගතිතොත් ගෙවෙන්නේ කී දවස ද?

සකු අකුරු ලියා හැඳින්වියැ යුතු වුව ද, මෙහි එ බන්ද-කට ඉඩ නැති. සකු හෝඩි පොතක් — බොම්බායේ අකුරු ඇති එකක්* — සපයාගෙනැ බලාගත මැනැවි. ඇබැසි සපුරා, දත් තැනක් ලවා බලවාගත හොත් වඩාලා මැ සුදුසු යැ. අකුරටත් ඇබැසියටත් අප පිහිට පතතොත් පහිණ විසඳමට සත හයේ මුද්දරයක් එවමින් විමසන්නැ.

මෙයින් ඉගැන්වෙනුයේ, සකුව මැ නො වේ පාළිය ද නිකම් මැ පහළ වෙයි. අලුත් මැ මගෙහිති. එ කො තරම් පහසු ද යනු එළි වන් වත් ඔබට මහ සොම්නස් උපදිනු නියත යැ.

කුමාරතුංග මුනිදාස

2487 පොසොන් පුර 2.
පාණදුරේ දී යැ.

---

*මේ සඳහා සංස්කෘත බාලාදර්ශ නම් පොත මැනැවි. M. D. ගුණසේන වෙළෙඳ හලින් ලබාගත හැකි.

ඉරේ සකුව

පලමු වන පොත

1. පෑදුම

1. ඔබ අද උගන්නේ ර, ස, ග, ම, හ යන අකුරු පස යැ.

2. එ අකුරු පස සකුයෙන් ලියන්නැ. ඔවුන් ඇති ඇති සේ එය පුරුදු කළ යුතු.

3. මේ එක් එක් අකුර බිඳුව යොදා ලියන්නැ.

   රං සං ගං මං හං

4. මේ එක් එක් අකුර දෙ බිඳුව යොදා ලියන්නැ.

   රඃ සඃ ගඃ මඃ හඃ

5. සකු අකුරු සතරෙකැ මැ එක්වන් මුඳුන් ඉරක් යන සැටි සිතට ගන්නැ. 'හ' යන්නට ඒ මුඳුන් ඉර පිරී නැති.

6. පහතැ පෙනෙන වදන් සකු අකුරින් ලියන්නැ. එක් එක් පදයේ සියලු අකුරු ලියුවාට පසු යැ මුඳුන් ඉර අඳින්නේ. 'හ' යන්නට මුඳුන් ඉර පිරී නැති බව හොඳට සිතට ගත යුතු.

රසං	සමං	රංගං	හගං	සංගමං	සමරං
රසඃ	සමඃ	රංගඃ	හගඃ	සංගමඃ	සමරඃ

7. ‘රසඃ’ යන අෑ ලෙසින් දෙ බිඳුයෙන් කෙළවර වන නම පුසු (පුම්) ළිඟු යෑ.

‘රසං’ යන අෑ ලෙසින් බිඳුයෙන් කෙළවර වන නම නිපුස් (නපුංසක) ලිඟු යෑ.

8. **තේරුම**

රසං	— රසය	භගං	— වාසනාව
රසඃ	— ,,	භගඃ	— ,,
රංගං	— නළුව	සමං	— සමය
රංගඃ	— ,,	සමඃ	— ,,
සමරං	— යුද්ධය	සඞගමං	— එක්වීම
සමරඃ	— ,,	සඞගමඃ	— ,,

පාළිය

පාළිය අමුතු බසෙක් නො වේ සකුව දන්නකුට පාළිය ඉබේ මැ උගන්නට මසෙකුත් නො යේ. එය උගන්නට අවුරුදු ගණන් මරන්නෝ පවක් කෙරෙති.

1. පාළියෙහි දෙ බිඳුව නැති සකුයෙහි යම් තැනෙකැ ‘අ’ යන්න හා යෙදුණු දෙ බිඳුව (‘අඃ’ යන්න) වේ නම්, එය ‘ඕ’ යන්නට හරවන්නැ.

රාමඃ	=	රාමෝ	මදඃ	=	මදෝ
බාලඃ	=	බාලෝ	අයඃ	=	අයෝ

මෙ තැනැ දෙන ලද සකු වදන් පාළියට පෙරළීමට දත යුතු එ පමණ යෑ

2. මේ නයින්, සකු පැටුමට දුන් වදන් දෙළොස පාළියට නගන්නැ.

2. පැදුම

1. සකු අකුරින් ලියන්නැ.

ර්, ස්, ග්, ම්, භ්,
රා, සා, ගා, මා, භා,
රි රී, සි සී, ගි ගී, මි මී, භි භී,
රු රූ, සු සූ, ගු ගූ, මු මූ, භු භූ,

2. හල් අකුරු හැර අන් සියල්ල බිඳුව යොදා (සකු අකුරින්) ලියන්නැ.

3. එ සියල්ල දෙ බිඳුව යොදා ලියන්නැ.

4. සකු අකුරින් ලියන්නැ පහතැ පෙනෙන වදන්.

රාගඃ	(රාගය)	සාගරඃ	(සයුර)
ගිරිඃ	(පව්ව)	සීමා	(ඉම)
ගුරුඃ	(ඇදුරු)	සූරඃ	(හිරු)
ගුරූ	(ඇදුරෝ දෙ දෙන)	සූරිඃ	(පඬුවා)
ගංගා	(ගඟ)	භාගඃ	(කොටස)
ගීඃ	(වදන)	භාරඃ	(බර)
භූරිඃ	(බොහොව)	මාරඃ	(මරුවා)
භීමඃ	(භීමයා)	මීමාංසා	(විමැසීම)
භීරුඃ	(බිය-ගුල්ලා)	මීරඃ	(සයුර)
භූමිඃ	(බිම)	මූරඃ	(එ නම් අසුරයා)
රසම්	(කිරි)	මූරා	(එ නම් ගැහැනිය)
මාංසම්	(මස්)	මූරුඃ	(එ නම් රට)

5. රාග, සූර, භීම, මාර, ග්‍රාම (ගම), ගජ (ඇතා), අජ (එළුවා) යන පුසු ලිඟු නමුත්

පත්‍ර, පුෂ්ප, නෙත්‍ර, ජල යන තිපුස් නමුත් පළමු වැනි වර ගන්වන්නැ (වර නඟන්නැ.)

6. පශ්‍ය (දැකීමෙහි), ගච්ඡ (යාමෙහි), ඛාද (කෑමෙහි), තිෂ්ඨ (සිටීමෙහි), පත (වැටීමෙහි) යන පවතු අඟු (ක්‍රියාඞ්ග) දූත් කලැ ගැනෙන තැනියෙහි (වර්තමාන කාල ප්‍රථම පුරුෂයෙහි) වර නඟන්නැ.

7. මේ කියමන් හෙළුවට නඟන්නැ :—

සුරඃ භීමං පශ්‍යති.
අජෞ පත්‍රාණි ඛාදතඃ.
පත්‍රාණි පතන්ති.
භීමඃ ග්‍රාමං ගච්ඡති.
ගජාඃ තිෂ්ඨන්ති.

8. 7 වැනි පුහුයේ (පැනයේ) කියමන්වලැ සියලු පද ගිණිය (බස) වෙනස් කොටැ කියමන් ලියන්නැ. (එක් ගිණි පද දෙ ගිණි ද බුහු ගිණි ද කළ යුතු. දෙ ගිණි පද එක් ගිණි ද බුහු ගිණි ද කළ යුතු. බුහු ගිණි පද එක් ගිණි ද දෙ ගිණි ද කළ යුතු.)

මෙය විමසන්නැ.

(1)	සුරඃ	සුරෞ	සුරාඃ
(2)	සුරම්	සුරෞ	සුරාන්

අරුත්

(1)	සුර තෙමේ	දෙ සුරයෝ තුමූ	සුරයෝ තුමූ
(2)	සුරයා	දෙ සුරයන්	සුරයන්

මේ සකුයෙහි ‘අ’අත් පුහු ලිඟු (‘අ’ කාරාන්ත පුරුෂ-ලිඞ්ග) ‘සුර’ නාමය පළමු වන දෙ වන වර (විභක්ති) ගත් සැටි යැ.

(1)	ඵලං	ඵලෙ	ඵලානි
(2)	ඵලං	ඵලෙ	ඵලානි

අරුත්

(1)	ගෙඩිය	දෙ ගෙඩිය	ගෙඩි
(2)	,,	,,	,,

මේ 'අ'අත් නිපුස් ('අ'කාරාන්ත නපුංසක) 'ඵල' නමුයෙ වර ගත් සැටි යැ.

සකුයෙහි ගිණි තුනෙකි. එක් ගිණි (Singular) දෙ ගිණි (Dual), බුහු ගිණි (Plural) යැ යි. දෙ දෙනකු ගැනෙන තැන දෙ ගිණි යි.

ක්‍රීඩති	ක්‍රීඩතඃ	ක්‍රීඩන්ති

අරුත්

කෙළී	කෙළිති	කෙළිති

'ක්‍රීඩ' යනු පවතු අඟුව (ක්‍රියාඞගය) යි.

'ති' යනු ද
'තඃ' ,,
'අන්ති' ,,

පවතු වර (ක්‍රියා විභක්ති) යි.

'ති'	යනු	එක් ගිණි	යැ
'තඃ'	,,	දෙ ගිණි	,,
'අන්ති'	,,	බුහු ගිණි	,,

එකකු පවත්නා කලැ එක් ගිණි ද, එද දෙනකු පවත්නා කලැ දෙ ගිණි ද, වැඩි දෙනකු පවත්නා කලැ බුහු ගිණි ද යෙදේ

බාලඃ	ක්‍රීඩති	(දරුවා කෙළී)
බාලෞ	ක්‍රීඩතඃ	(දෙ දරුවෝ කෙළීති)
බාලාඃ	ක්‍රීඩන්ති	(දරුවෝ කෙළිති)

පාළිය

1. 'අ' යන්න හැර සෙසු අකුරෙකින් පසු වැ දෙ බිඳුව (ඃ) යෙදුණු පදයක් පාළියට පෙරළන කලැ දෙ බිඳුව (ඃ) හැර-දමන්නැ.

බාලාඃ	=	බාලා
හරිඃ	=	හරි
ලක්ෂ්මීඃ	=	ලක්ඛී
ප්‍රභුඃ	=	පභු
වධූඃ	=	වධූ

2. බිඳුවට හෝ හල් හඬකට හෝ පෙරටු වැ යෙදුණු දිගු හඬ කොට කරන්නැ.

මාංස	=	මංස
නේත්‍ර	=	නෙත්ත
ගෝත්‍ර	=	ගොත්ත

3. පාළියෙහි දෙ ගිණි බසෙක් නැති. සකුයෙහි දෙ ගිණි පදය වෙනුවට ද පාළියෙහි බුහු ගිණි පදය මැ යොදන්නැ.

සුරෞ	=	සුරා
ක්‍රීඩතඃ	=	කීළන්ති
ඵලෙ	=	ඵලානි

සකු		පාළි
ග්‍රාම	=	ගාම
පුෂ්ප	=	පුප්ඵ
නෙත්‍ර	=	නෙත්ත
පත්‍ර	=	පත්ත
පශ්‍ය	=	පස්ස
තිෂ්ඨ	=	තිට්ඨ
ක්‍රීඩ	=	කීළ
සුරම්	=	සුරං
සුරාන්	=	සුරෙ

(නෙස්සෙහි වෙනසෙක් නැති.)

ඇබෑසිය

1. සකු ඇබෑසියේ සතර වැන්නෙහි සියලු පද පාළියට පෙරළන්නැ.
2. පස් වැන්නෙහි දැක්වූ නමූ පාළියට වර නඟන්නැ.
3. ස-වැන්නෙහි පවතූ අඟු පාළියට වර නඟන්නැ.
4. සත් වැන්නෙහි කියමන් පාළියට පෙරළන්නැ.
5. අට වැන්නෙහි කියමන් පාළියට පෙරළන්නැ.

---

3. පැදුම

1. ට ඨ ද ඪ යන හඬ දෙන සකු අකුරු ලියා පුරුදු කරන්නැ.
2. එ සතරත් ර, ස, ග, ම, හ යන පසත් හල් ලකුණු, ඇල පිලි, (ලුහු දිගු) ඉස් පිලි, ඇල පිලි ගැට ගන්වා ලියන්නැ.
3. හල් අකුරු හැර අන් සියල්ල බිඳු සහිත කොටැ දෙ බිඳු සහිත කොටැ ලියන්නැ.
4. මේ සකු වදන් ලියන්නැ සකු අකුරින් :—

සටා	(කෙසුරු)	ගාඪම්	(ඉතා දැඩි)
හටඃ	(සුදුවං)	රූඪඃ	(නැඟුණු අරුත)
රදඃ	(දත)	මදිරා	(සුරා)
මදඃ	(එඩිය)	මුද	(සතුට)
ගදා	(ගදාව)	හිඬුරම්	(හෙණ)
සභා	(සබය)	දරුම්	(දර)
දරී	(ගුහාව)	දරාඃ	(අඹුවෝ)
මඨම්	(මඩම)	ගුඪඃ	(සැඟැවුණු)
ගාඪඃ	(ඉතා දැඩි)	ගුඪා	,,
ගාඪා	,,	ගුඪම්	,,

5. හට, රද, ගිරි (පර්වත), ගුරු (ඇදුරා) යන පුංලිඟු නමුත්

මාංස (මස්), වාරි (දිය), මධු (මී පැණි) යන නපුංස් ලිඟු නමුත්

පළමු වැන්නෙහිත් දෙ වැන්නෙහිත් වර නගන්නැ.

6. රක්ෂ (රැකීමෙහි), භව (වීමෙහි), යුධ්‍ය (යුද කිරීමෙහි), විකාස (පිපීමෙහි), ඵල (පල දැරීමෙහි), පුෂ්ප්‍ය (මල් දැරීමෙහි), ම්ලාය (මැලැවීමෙහි) යන පවතු අඟු (ක්‍රියාඞග) දුත් කලැ ගැනෙන තැනියෙහි (වර්තමාන කාල ප්‍රථම පුරුෂයෙහි) වර නගන්නැ.

7. මේ කියමන් හෙළුවට පෙරලන්නැ.

භටෞ යුධ්‍යතඃ.

මධු මධුරං භවති.

ගජාඃ වාරි පිබනති.

අජාඃ මාංසං න ඛාදනති.

ගුරුඃ මධු පිබති.

ගිරිඃ විශාලඃ.

ගජඃ රදෞ රක්ෂති.

විකාසන්ති පුෂ්පාණි.

ඵලති වෘක්ෂඃ.

ම්ලායතඃ කුසුමෙ.

වෘක්ෂඃ පුෂ්ප්‍යති.

ගජාඃ ච අජාඃ ච පත්‍රාණි ඛාදනති.

8. සත් වැනි පුසුයේ (පැනයේ) කියමන්වලැ සුදුසු සියලු තන්හි වදන්, ගිණි (බස්) පෙරලා ලියන්නැ (එක් ගිණි පද දෙ ගිණි බුහු ගිණි ද, දෙ ගිණි පද එක් ගිණි බුහු ගිණි ද, බුහු ගිණි පද එක් ගිණි දෙ ගිණි ද කළ යුතු.)

මෙය විමසන්නැ.

1.	කපිඃ	කපී	කපයඃ
2.	කපිම්	කපී	කපීන්
1.	ආබුඃ	ආබූ	ආබවඃ
2.	ආබුම්	ආබූ	ආබූන්
1.	සුරභි	සුරභිනී	සුරභීනි
2.	,,	,,	,,
1.	වසතු	වස්තුනී	වස්තූනි
2.	,,	,,	,,

තේරුම්

1.	වඳුරා	දෙ වඳුරෝ	වඳුරෝ
2.	වඳුරා	දෙ වඳුරන්	වඳුරන්
1.	මීයා	දෙ මීයෝ	මීයෝ
2.	මීයා	දෙ මීයන්	මීයන්
1.	සුවඳ	දෙ සුවඳ	සුවඳ
2.	,,	,,	,,
1.	වත	දෙ වත	වත්
2.	,,	,,	,,

මේ යැ 'ඉ'යත් ('ඉ'කාරාන්ත) 'උ'වත් ('උ'කාරාන්ත) නමු පළමු වන දෙ වන වර (විබත්) ගත්තා සැටි.

'ඉ'යත් පුනු ලිඟු 'කපි' සඳ හි.
'උ' ,, ,, 'ආබු' ,,
'ඉ' ,, නිපුන් ලිඟු 'සුරභි' ,,
'උ' ,, ,, 'වසතු' ,,

මෙහි එක එක රූපය මැනැවින් පිරික්සා එක-එකෙහි වෙනස හොඳින් සිතට ගන්නැ.

හෙළි (නිපාත)

නොවරනැගෙන සද මෙ නම්.

'න' යනු හෙළුයෙහි 'නො' යනු යැ.
'ච' ,, ,, 'ද' ,,
ගච්ඡති (යෙයි) න ගච්ඡති (නො යෙයි.)
බාලඃ ච ගුරුඃ ච (බාලයා ද ගුරු ද)

පාළිය

ඇබෑසිය

1. සකු 4 වැන්නෙහි සියලු වදන් පාළියට පෙරළන්නැ.
2. පස් වැන්නෙහි සියලු නමු පාළියට වර නගන්නැ.
3. ස වැන්නෙහි සියලු පවතු අඟු පාළියට වර නගන්නැ.
4. සත් වැන්නෙහි සියලු කියමන් පාළියට පෙරළන්නැ.
5. එහි වදන්වලැ ගිණි (බස්) පෙරළිය ද කරන්නැ.

මෙය විමසන්නැ.

දෙ වන පැදුමෙහි පැවැසුණු දෑ යළි දු කියවා බැලියැ යුතු යැ.

සකුයෙහි පද කෙළවරැ 'ම්' යනු පාළියෙහි 'ං' වෙයි.

සුරම් = සුරං
කපිම් = කපිං
ආබුම් = ආබුං

සකුයෙහි දෙ වැනි වර බුහු ගිණියැ 'ආන්' යනු පාළියෙහි 'ඒ' වෙයි.

සුරාත් = සුරෙ
ගජාත් = ගජෙ

සකු	පාළි
ගාඪ	ගාළ්හ
රූඪ	රූළ්හ
ගූඪ	ගූළ්හ
රක්‍ෂ	රක්ඛ
යුධ්‍ය	යුජ්ඣ
පුෂ්ප්‍ය	පුප්ඵ
ම්ලාය	මිලාය
කපිඃ	කපි
කපයඃ	කපී කපයො
කපීන්	කපී කපයො
ගුරුඃ	ගුරු
ගුරවඃ	ගුරූ ගුරවෝ
ගුරූන්	ගුරූ ගුරවෝ

'ගාළ්හ' ආ තන්හි දිගු හඬ ලුහු නො වී යැ. වෙසෙසෙකි.

සකුයෙහි පළමු වරැ බුහු ගිණියැ 'කපයඃ' යනු වේ. පාළියෙහි ඒ 'කපයෝ' යැ යි සිටී. එහි මැ 'කපී' යන්නෙක් ද වෙයි. එ නම් සකුයෙහි 'කපී' යන දෙ ගිණිය යි. පාළියෙහි දෙ ගිණියක් නැති බැවින් සකුයෙහි දෙ ගිණි රුව ද පාළියෙහි බුහු ගිණි රුව වැ සිටී.

'ගුරූ' 'ගුරවො' යන රූ ද මෙ සේ මැ විමසන්නැ.

සකුයෙහි දෙ වැනි වර දෙ ගිණි 'කපී' 'ගුරූ' යනු වෙයි. මෙ දෙක පාළියෙහි බුහු ගිණි වෙයි.

බුහු ගිණියැ සකුයෙහි වන 'කපීන්' 'ගුරූන්' යන දෙක ද 'න්' යන්න නැසීමෙන් 'කපී' 'ගුරූ' කියා මැ වෙයි. එහි ලා 'කපයෝ' 'ගුරවෝ' යනු පාළියට මැ ඇරුණේ යැ.

මේ දැ කියවා සිතට ගත මැනැවි. එ කලැ එක්තරා නියරක් (ක්‍රමයක්) ඇති බව වැටැහෙන්නට වෙයි. ඔබට නිකම් මැ මෙන් පාළි දැනුම එන්නට වනුයේ එ විටැ යැ.

---

4. පැදුම

ඇබැසිය

1. ර, ස, ග, ම, හ, ට, ය, ද, ඝ යන මේ හැම දැන් ඔබ දන්නා සියලු පිළි ගන්නා ලියන්නැ.

2. ලියන්නැ මෙ සකු වදන් සකු අකුරින්.

භෘගුඃ (එ නම් රුසියා)	භෘඞ්ගාරඃ (කොතලය)
භෘඞ්ගඃ (බිඟුවා)	භෘඞ්ගී (බිඟුවිය)
මෘද් (මැටි)	සෘදරඃ (සපියා)
මෘදංගඃ (මිහිඟු බෙරය)	සෘගඃ (අවිය)
මෘදුඃ (මුදු)	සෘමරඃ (තරුණ මුවා)
මෘගඃ (මුවා)	දෘශඃ (දෑසි)
මෘගී (මුව දෙන)	දෘශා (,,)
මෘගමදඃ (කස්තුරි)	දෘශම් (,,)

3.

'අ'යත්	පුසු ලිඟු	'දෘශ'	නමුව ද
'ඉ'යත්	,,	'පති'	,,
'උ'වත්	,,	'භෘගු'	,,
'අ'යත්	නිපුස් ලිඟු	'දෘශ'	,,
'ඉ'යත්	,,	'ශුචි' (පිරිසුදු)	,,
'උ'වත්	,,	'අශ්‍රු' (කඳුළු)	,,

'ආ'අත් ළද ලිඟු 'දුඝා' නමුව ද
" " 'සභා' "

පළමු වැත්තට ද දෙ වැත්තට ද වර නඟන්නැ.

4. නම (වැදීමෙහි), උපවිශ (හිඳීමෙහි), උත්තිෂ්ඨ (නැගී-මෙහි), ධාව (දිවීමෙහි), පඨ (පැටුම්හි — පාඩම් කිරීමෙහි.)

මේ පවතු අඟු දූත් කල් ගැනෙන තැතියට (ප්‍රථම පුරුෂයට) වර නඟන්නැ.

5. මෙ කියමන් සකුවට හැරැවුව මැතැවි.

බිගුවා මල දකී.
කොළ කති මුවෝ.
ඇත්තු ද එළුවෝ ද මුවෝ ද දිය බොති.
බාලයෝ දෙ දෙන ගුරුත් වඳිති.
ගුරුහු හිඳිති. බාලයෝ නැගිටිත්.
දිවෙති මුවෝ දෙ දෙන.
මස් නො කති වඳුරෝ.
දකිත් ගුරුහු එළුවන්.
පල දරයි ගස් දෙක.
පිජේ මල්.

6. එ සකු කියමන් ගිණිය (බස්) පෙරළා ලියුව මැතැවි.

කියවා සිතට ගන්නැ.

'ආ'අත් ළද ලිඟු (ස්ත්‍රී ලිංග) 'අජා' නමුව

1.	අජා	අජේ	අජාඃ
2.	අජාම්	අජේ	අජාඃ

තේරුම

1.	එළිය	දෙ එළියෝ	එළියෝ
2.	එළිය	දෙ එළියන්	එළියන්

එළිය නම් එළු දෙන යෑ.

'අ'අත් පුසු ලිඟු නමු
,, නිපුස් ,, ,,

මේ දෙකෙහි වර නැඟෙන සැටි මෙය හා සසඳන්නෑ. වෙනස සිතට ගන්නැ

සකුයෙහි ලිඟු බෙදුම හෙළුයෙහි ලිඟු බෙදුමට වඩා වෙනසි.

අජඃ	අජෞ	අජාඃ
අජම්	අජෞ	අජාන්

මෙ සේ වර නැඟෙන සියලු නමු පුසු ලිඟු සි. පණ'තියකු ගැනුණ ද, පණ නැතියක් ගැනුණ ද වෙනසෙක් නො වේ. වර නැඟීම බලා යෑ ලිඟුව කියනුයේ. 'වෘක්ෂ' යනුත් පුසු ලිඟු සි. පිරිමියෙක් නො වේ.

අජා	අජෙ	අජාඃ
අජාම්	අජෙ	අජාඃ

මෙ සේ වර නැඟෙන සියලු නමු ළඳ ලිඟු සි. 'සභා' යනු ද ළඳ ලිඟු සි. ඒ ගෑහැතියක් නො වේ. 'අජා' යනු මෙන් වර නැඟෙන හෙයින් ළඳ ලිඟු සි.

ඵලම්	ඵලෙ	ඵලානි
ඵලම්	ඵලෙ	ඵලානි

මෙ සේ වර නැඟෙන සියලු නමු ද නිපුස් ලිඟු සි.

'අපත්‍ය' යනු දරුවාට නමි. එකෙත් නිපුස් ලිඟු සි. ඇයි?

අපත්‍යම්	අපත්‍යෙ	අපත්‍යානි
අපත්‍යම්	අපත්‍යෙ	අපත්‍යානි

යෑ යි වර නැඟෙන හෙයිනි.

'කලත්‍ර' යනු අඹුවට නමි. එහෙත් නිපුස් ලිඟු යි. ඇයි?

කලත්‍රම්	කලත්‍රෙ	කලත්‍රාණි
කලත්‍රම්	කලත්‍රෙ	කලත්‍රාණි

යැ යි වර නැඟෙත හෙයිනි.

සැබැවින් පුසු ලිඟු විය යුතු නමුවක් ලඳ ලිඟු හෝ නිපුස් ලිඟු හෝ විය හැකි බවත්, සැබැවින් ලඳ ලිඟු විය යුතු නමුවක් පුසු ලිඟු හෝ නිපුස් ලිඟු හෝ විය හැකි බවත්, සැබැවින් නිපුස් ලිඟු විය යුතු නමුවක් පුසු ලිඟු හෝ ලඳ ලිඟු හෝ විය හැකි බවත් මෙයින් පෙනේ. ඒ පෙරළිය වනුයේ වර නැඟීමෙනි.

නිකමට කියවා බලන්නැ.

ශ්‍රීගණේශම් අහං නමාමි. (සිරි ගණිසුරුහු මම වඳිමි.)

ආචාර්‍ය්‍යාන් අහං නමාමි. (ඇදුරන් මම වඳිමි.)

ශ්‍රීගණේශං ත්වං නමසි. (සිරි ගණිසුරුහු තෝ වඳිහි.)

ආචාර්‍ය්‍යාන් ත්වං නමසි. (ඇදුරන් තෝ වඳිහි.)

අයං බාලඃ ශ්‍රීගණේශම් නමති. (මේ බාල තෙමේ සිරි ගණිසුරුහු වඳී.)

ආචාර්‍ය්‍යාන් අයං නමති. (ඇදුරන් මේ තෙමේ වඳී.)

නිකම් මැ තේරෙන ලෙසෙක් නො වේ ද පෙනෙනුයේ? සකුව කෙළින් මහැ යන බසෙකි. එ හෙයින් ඉගෙනීම ඉතා පහසු යැ. එය ඉක්මනින් මැ කළ හැකි යැ.

සිලොවක් (ශ්ලෝකයක්) ගයන්නැ.

කුමට ද පැරැණි සිලොවක් ගයන්නේ? හදමු අලුත් එකක්.

පඨාමි
ලිඛාමි
ගායෝමි
වදමි.

එය මැ තනමු හෙළුවට.

පටමි
ලියමි
අසමි
කියමි.

තදමූ තව එකක්.

සංස්කෘතං පඨාමි
හෘද්ගතං කරෝමි
අභිමුද්ධරාමි
පණ්ඩිතෝ භවාමි.

සකුව පටමි
හදෙහි කෙරෙමි
අරුතු'ද්දුරමි
පඬුවෙක් වෙමි.

කොතරම් ලෙහෙසි ද සකුව?

'හෘද්' නම් ළය යි. 'ගත' යනු 'ගියේ' යන අරුත දෙයි. ළයට ගියේ 'හෘද්ගත' යි. හෘද්ගත කිරීම නම් සිතියේ රඳවා-ගැනීම යි.

අභිම් + උද්ධරාමි = අභිමුද්ධරාමි
පණ්ඩිතඃ + භවාමි = පණ්ඩිතො භවාමි

'අඃ' යනු 'ඔ' වූ හැටි බලත්තා. එ සේ වනුයේ සියලු තන්හි නො වේ, ඝොස'කුරක් පසු වැ සිටි තන්හි යැ.

පැරැණි සොලොවකුත් කියමු.

'සවගෘහෙ පූජ්‍යතෙ මූර්ඛඃ
සවග්‍රාමෙ පූජ්‍යතෙ ප්‍රභුඃ
සවදෙශෙ පූජ්‍යතෙ රාජා
විද්වාන් සර්වත්‍ර පූජ්‍යතෙ.'

සිය ගෙයි මැ පිදේ හිස්-හිස්.
සිය ගම්හි පිදේ පොහොවු.
සිය දෙස්හි පිදේ මී-පල්.
විදුමත් කො තැනැත් පිදේ.

ලියමු ගැට-පදයක්.

සව-ගෘහෙ	—	සිය ගෙහි.
මූර්ඛඃ	—	මෝඩයා; හිස හිස් තැනැත්තා.
පූජ්‍යතෙ	—	පුදනු ලැබේ.
ප්‍රභුඃ	—	පොහොසතා; පොහොවුවා.
විද්වාන්	—	උගතා; විදුමතා.
සර්වත්‍ර	—	සියලු තන්හි; කො තැනැත්.

ඔබට දූත් මේ තො තේරේ ද? සැබැවින් තේරේ.

පාළිය

ඇබෑසිය

1. සකු දෙ වැත්තෙහි සියලු වදන් පාළියට පෙරළන්නැ.
2. තුන් වැත්තෙහි සියලු නමු පාළියට වර නගන්නැ.
3. සතර වැත්තෙහි සියලු පවතු පාළියට වර නගන්නැ.
4. පස් වැත්තෙහි කියමන් පාළියට පෙරළන්නැ. (සකු-යෙහි දෙ ගිණිය පාළියෙහි බුහු ගිණි යි.)
5. එ කියමන් ගිණි පෙරළා ලියන්නැ.

සිතට ගන්නැ.

සකු	පාළි
භෘගු	භගු
භෘඞ්ග	භිඞ්ග
මෘද්	මත්ති
මෘදඞ්ග	මිදඞ්ග
මෘදු	මුදු
මෘග	මිග
සෘදර	සිදර
සෘග	සිග
සෘමර	සිමර
දෘඪ	දළ්හ
උපවිශ	උපවිස
උත්තිෂ්ඨ	උත්තිට්ඨ
අජාම්	අජං
අජාඃ	අජා, අජායෝ

---

5. පැදුම

ඇබෑසිය

1. ෂ, ඵ, ඝ, ණ යන මෙය සකු අකුරින් ලියන්නැ.
2. පෙරැ උගත් සියලු අකුරැත් මේ අකුරැත් දූත් දන්තා සියලු පිළි ගන්වා ලියන්නැ.
3. ලියන්නැ මේ සකු වදන් සකු අකුරින්:—

පාඨඃ	(පෙළ, පාඩම)	මෘෂා	(බොරුව)
පීඨම්	(පුටුව)	භාෂා	(බස)
පුරඃ	(පුරය)	භූෂණම්	(සැරසිල්ල)
පුරී	(,,)	ගුණඃ	(ගුණය)

පුරුෂඃ	(පුරිසා)	දූෂණම්	(කෙලෙසිල්ල)
පෘෂ්ඨම්	(පිට)	දෘෂ්ටිඃ	(ඇස)
පෘෂ්ණිඃ	(විළුඹ)	රණඃ	(යුද)
ඵණඃ	(පෙණය)	දෘෂ්ටඃ	(දක්නා ලද)
ඵණා	(,,)	දෘෂ්ටා	(,,)
ඵාණිඃ	(පැණි)	දෘෂ්ටම්	(,,)
පුරාණඃ	(පැරණි)	පරුෂඃ	(තපුරු)
පුරාණා	(,,)	පරුෂා	(,,)
පුරාණම්	(,,)	පරුෂම්	(,,)

4. සූරි (උගතා,) අරි (සතුරා,) නිධි (නිදන — නිධානය,) ඌර්මි (තරඟ — රළ,) ප්‍රභු (පොහොසත්,) පටු (සමත් — දක්ෂ,) අණු (අණුව—ඉතා කුඩා කොටස) යන පුසු නම් ද

භූමි (බිම,) ඌර්මි (රළ — තරඟ,) ඵාණි (පැණි,) ධෙනු (දෙන,) තනු (සිරුර) යන ලිඟු නම් ද

ලඝු (ලුහු,) ගුරු (බර) යන නපුස් නම් ද

පළමු වැන්නෙහිත් දෙ වැන්නෙහිත් වර නඟන්නැ.

5. දශීය (දූක්වීමෙහි) වර (හැසිරීමෙහි) පවතූ අගු දූන් කලට වර නඟන්නැ.

6. මේ කියමන් සකුවට පෙරළන්නැ:—

ශිෂ්‍යයෝ පැටුම් පටත්.
උගත්තු පැරණි පොත් කියවත්.
ලංකාව පැරණි බිමෙක් වේ.
පොහොසත්තු දෙ දෙන ධනය රකිති.
නාගයා දක්වයි පෙණය.
පුරුෂයා පුටුව දකී.
බාලයෝ නො බොත් පැණි.
භාෂාව පැරණි වේ.

7. එ සේ පෙරළූ සකු කියමන්හි ගිණිය පෙරළන්නැ.

8. හෙළුවට තගන්නා.

තභසො භූෂණං වපෙද්‍රා
නාරීණාං භූෂණං පතිඃ
පෘථිව්‍යා භූෂණං රාජා
විද්‍යා සර්ව්‍ර භූෂණම්

විමසුව

'ඉ'යත් ළද ලිඟු 'භූමි' නමුව

1.	භූමිඃ	භූමී	භූමයඃ
2.	භූමිම්	,,	භූමීඃ

තේරුම

1.	බිම	දෙ බිම්හු	බිම්හු
2.	බිම	දෙ බිමත්	බිමත්

හෙළුවට වඩා හුරු මෙ ශේ යැ:—

1.	බිම	දෙ බිම	බිම්
2.	,,	,,	,,

'ඉ'යත් පුසු ලිඟු නමුයේත් ළද ලිඟු නමුයේත් වෙනස දෙ වන බුහු ගිණියෙහි පමණ යැ

'කපි'	නමුව	කපිත්
'භූමි'	,,	භූමීඃ

ළද ලිඟු නමුවෙක් 'න්' යන්න නම් නො ගනී

'උ'වත් ළද ලිඟු 'ධෙනු' නමුව

1.	ධෙනුඃ	ධෙනූ	ධෙනවඃ
2	ධෙනුම්	,,	ධෙනූඃ

'උ'වත් පුසු ලිඟු 'ගුරු' නමුයේ රූත් මෙ රූත් සමයන්නා. දෙ වන බුහු ගිණි රූව පමණ යැ වෙනස්.

ගුරූත් — ධෙනූඃ

ගුණ නමු

ගුණයක් හඟවන නමුව තුන් ලිඟු වෙයි. යම් නමුවෙකැ ගුණය ද ඉන් හැඟැවෙනුයේ, එ ද ඒ නමුයේ ලිඟුව ගනී.

පරුෂඃ පුරුෂඃ (නපුරු පුරිසා)
පරුෂා ස්ත්‍රී (නපුරු ළඳ)
පරුෂං වචනම් (නපුරු වදන)

සකුයෙහි වෙසෙසුන (විශෙෂණය) ද වර ගෙනැ සිටී.

උගත්තු නපුරු වදන් නො කියත්.
සූරයඃ පරුෂාණි වචනානි න වදනති.

සොළොවේ ගැට-පදය

නභසො — (නභසඃ) ආකාශයා ගේ (අහසේ) 'නභස්' නමුව. ස-වැනි වර එක් ගිණිය.

භූෂණං — සැරසිල්ල, අලංකාරය.

නාරීණාං — ළඳුන් ගේ. 'නාරී' නමුව. 6. බුහු ගිණිය.

පෘථිව්‍යා — (පෘථිව්‍යාඃ) පොළොවේ (පෘථිවිය ගේ.) 'පෘථිවි' නමුව 6. එක් ගිණිය.

විද්‍යා — දැනීම. උගත් කම.

සර්වස්‍ය — සියල්ලන් ගේ. 'සර්' නමුව. 6. එක් ගිණිය. Of all හෙළගෙන් 'සියල්ලන් ගේ' යැ යි බුහු ගිණිය වෙයි.

නව සිලොවක් උගනිමු

අසාරෙ බලු සංසාරෙ
සාරං ශ්වශුරමන්දිරම්.
හරො හිමාලයෙ ශෙතෙ.
හරිඃ ශෙතෙ මහොදධෞ.

තනමු හෙළුවට

අසාර සසරේ වත්තාං
සාර යි මයිලණුවත් විමත්
හරාං හොවී හිමවු පව්වේ.
හරි මාං සයුරේ හොවී.

ලියමු ගැට-පදය.

බලු — 'වනාංහි' යන්නට සමාන යැ. 'අසාරේ සංසාරේ බලු' යැ යි පිළිවෙළ යි.

ශවශුර — මයිලාට (කිරිය ගේ පියාට) නම්.

හරෝ — (හරඃ) මෙංහෙසුරාං. ගේ සිය මයිලාං වූ හිමවුයෙනි වෙසේ. උමාං, හිමවු දූ යැ. එ හෙයිනි 'ගිරි දූ' නම.

ශෙතෙ — හොවී. සැතැජේ.

හරිඃ — වෙන්. විෂ්ණු. ගේ සිය මයිල් වූ මහ සයුරෙහි හොවී. කමලාං මුහුදින් පහළ වූවාං යැ. එ හෙසින් ඕ මුහුදු දූ යැ. ඇය ගේ සැමියාං යැ හරි.

මංහොංදධෞ — 'මහා + උදධි' යනු මහ සයුරට නමි. 'උදධෞ' සත් වන වර එක් ගිණී යි.

ඔබට දූන් සොංලොංවේ තේරුම පැහැදිලි යැ. එය ඔබ ගේ මැ බසින් ලියන්නැ

පාළිය

ඇබැසිය

1. සකු ඇබැසියේ තුන් වැන්නේ පද පාළියට පෙරළන්නැ.
2. සිවු වැන්නේ නමු පාළියට වර නගන්නැ.

3. පස් වැන්නේ පවතු අගු පාළියට වර තගන්නා.
4. ස වැන්නේ කියමන් තගන්නා පාළියට.
5. පෙරලන්නා එහි බස්.
6. පාළියට පෙරලන්නා එහි අට වැන්න.
7. 'අසාරේ' ආ සොලොවන් පෙරලන්නා පාළියට.

විමසුව

සකු	පාළි
පුරුෂ	පුරිස
පෘෂ්ඨ	පිට්ඨ
පෘෂ්ණි	පණ්හි

(පාළියෙහි ඇත්තේ 'ස' පමණෙකි, 'ශ' 'ෂ' නැති.)

සකු	පාළි
දෘෂ්ට	දිට්ඨ
පරුෂ	ඵරුස
ඌර්මි	උම්මි
ප්‍රභු	පභු
දශීය	දස්සය

('ර' යනු බැඳුණු අනෙක් අකුරේ රුව ගනී.)

ශිෂ්‍ය	සිස්ස

පසු වැ බැඳුණු 'ය' යන්න පෙර අකුරේ රුව ගනී.)

පුස්තකඃ	පොත්ථකො
චන්ද්‍ර	චන්ද
පෘථිව්‍යාඃ	පඨව්‍යා
විද්‍යා	විජ්ජා

('ද්‍ය' ජ්ජ වෙයි.)

භූමයඃ	භූමී, භූමියෝ
භූමීඃ	භූමි, භූමියෝ
ධෙනවඃ	ධෙනූ, ධෙනුයෝ
ධෙනූඃ	ධෙනූ, ධෙනුයෝ
ශ්වශුර	සසුර
ශෛත	සෙත
මහොදධෞ	මහොදධිම්හි / මහොදධියං

'මහණණව' (සකු — 'මහාර්ණව') යනු ද මුහුදට පාළි නමෙකි. 'මහණ්ණවෙ' යනු යැ 'සයුරෙහි' යන අරුත දෙනුයේ.

---

6. පැදුම

ඇබෑසිය

1. මෙ තෙක් උගත් පිලි ගැන්වූ එක් එක් අකුර හා රේඵය බැඳෙන සැටි සකු අකුරින් ලියා දක්වන්නැ.
2. දක්වන්නැ එ සේ මැ 'ර'කාරංශයත් බැඳෙන සැටි
3. රේඵය හා බිඳුව යෙදෙන සැටින් පෙන්වන්නැ.
4. මේ සකු වදන් ලියන්නැ සකු අකුරින්:—

දුගීඃ	(දුග)	පියමදීඃ	(පුටු මඳුවා)
සමග්‍රඃ	(සියල්ල)	භද්‍ර	(යහපත්)
මර්‍ම	(මරැ තැන)	දප්‍ඃ	(එඩිය)
සාංඝු	(අඟ ඇති)	සිප්‍රා	(එ නම් ගඟ)
දභ්‍ඃ	(කුස තණ)	පූර්ණ	(පිරුණු)
භ්‍රමඃ	(කර කැවිල්ල)	සම්පත්	(අබ)

5. 'ඊ'අත් ළඳ ලිඟු 'නදී' නමුව ද, 'ඌ'අත් ළඳ ලිඟු 'වධූ' නමුව ද මුල් දෙ බෙදුමට වර නගන්නැ.

6. ස්පෘශ (පැහැසීමෙහි, to touch,) වද (කීමෙහි,) භක්ෂය (කෑමෙහි,) ජිඝ්‍ර (ඇඟැරීමෙහි — ගඳ සුවඳ බැලීමෙහි, to smell,) ජල්ප (කීමෙහි,) පීඩය (පෙළීමෙහි) යන මේ පවතු අගු විර තනනු.

7. මෙ තෙක් උගත් වදන් යොදමින් සකු කියමන් දහයක් සපයන්නැ. පැදුමෙකැ වූ එක ද කියමනක් නො ගත යුතු.

8. ඒ කියමන්වලැ ගිණිය පෙරළන්නැ.

9. හෙළුවට පෙරළන්නැ:—

භ්‍රමඃ ශිෂ්‍යං පීඩයති
මූඪඃ නරඃ භද්‍රං න පශ්‍යති.
භවන්ති සාම්‍රාඃ වෘක්ෂාඃ.
හරිඃ ච රාමඃ ච පීයමදෞ භවතඃ.
සමීපං අපි පශ්‍යන්ති ගජාඃ.
ඝටෞ පූර්ණෞ භවතඃ.
න ඛාදන්ති තෘණං සිංහාඃ
චන්ද්‍රාලෝකඃ ශීතලඃ
උෂ්ණඃ සූර්යාලෝකඃ.
සිප්‍රාං පූර්ණාං පශ්‍යති කුමාරඃ

10. හෙළුවට නඟන්නැ:—

මද්‍යපාඃ කිං න ජල්පන්ති?
කිං න ඛාදන්ති වායසාඃ?
කවයඃ කිං න පශ්‍යන්ති?
කිං න කුර්වන්ති යොෂිතඃ?

රුකුල

මද්‍යපාඃ — මෙර පොයුවෝ. මද්‍යය (මත් කරවන දිය) පානය කරනුයේ මද්‍යප. 'අ'අත් පුසු ලිඟු නමු යි. මේ

තයින් ක්ෂීරය (කිර) බොනුයේ, රස බොනුයේ, ජලය බොනුයේ, රුධිරය බොනුයේ කිනම් වේ ද?

වායසා: — කපුටුවෝ. 'වායස' නමුව යි.

යොෂිතඃ — මාගම්මු, ගෑනු. 'යොෂිත්' නමුව යි.

යොෂිත්	යොෂිතෞ	යොෂිතඃ
යොෂිතම්	,,	,,

කුර්වන්ති — කෙරෙත්. මෙ තැනැ පවතු අඟුව 'කුරු' යනු යි කුරු + අන්ති = කුර්වන්ති. එක බසැ පවතු අඟුව 'කරු' යනු යි 'උ' 'ඕ' වේ.

කරොති, කුරුතඃ, කුර්වන්ති

මූඪ — මෝඩ, මූළා වූ.

ශීර්ෂං — හිස. 'ශීර්ෂ' නමුව නපුංස් ලිඟු යි.

හරිඃ — (නමෙකි) හරියා.

රාමඃ — (නමෙකි.) රාමයා.

පිඨමර්දී — පුටුව මදිනුයේ මෙ නම්. ඇතැම්මු නිකම් ගෙදරකට ගොස්, නිකම් පුටුවෙකැ හිඳැ කල් ගෙවා යෙති. ඔවුන් ගෙන් ඇති එක මැ වැඩය, පසු පසින් අර පුටුව මැදීම පමණ යැ. එ බත්දනට සකුයෙහි 'පීඨමර්දී' නම වේ. 'පුටු මඳු' යන්නෙහි අරුත ද සම යැ. පුටුව මදිනුයේ 'පුටු-මඳු.'

අපි — මෙ හෙළිය (නිපාතය) 'ද' 'පවා' යන අරුත් දෙයි.

වියයුරුව (ව්‍යාකරණය)

'ඊ'අත් ළඳ ලිඟු 'මහී' (පොළොව) නමුව.

1.	මහී	මහ්‍යෞ	මහ්‍යඃ
2.	මහීම්	,,	මහීඃ

'ඌ'අත් ළඳ ලිඟු 'චමූ' (සෙනඟ) නමුව.

1. වමූඃ වම්වෞ වම්වඃ
2. වමූම් ,, වමූඃ

තමු වර නඟන විට, අඟ, අකුර ද ලිඟුව ද හොඳින් හැඳිනීම ඉතා ඇවැසි වේ. අඟ'කුරේ සැටියටත් ලිඟුවේ සැටියටත් වර නැඟීම කෙසේ කෙසේ වෙනස් වේ දැයි සිතට ගන්න.

පැදි රසය

දැන් උගනිමු සොලොවක්:—

ඡායාමන්‍යස්‍ය කුර්වන්ති,
තිෂ්ඨන්ති ස්වයමාතපෙ.
ඵලාන්‍යපි පරාර්ථාය
වෘක්ෂාඃ සත්පුරුෂා ඉව.

පෙරළමු හෙළුවට:—

අනුන් හට කෙරෙත් සේයා,
තුමූ මැ අවුයේ සිටිත්.
පරන් හට යි පල පවා.
රුක්හු (මෙන්) වැනි සත් දනන්.

(වෘක්ෂාඃ) අන්‍යස්‍ය ඡායාම් කුර්වන්ති.
,, ස්වයං ආතපෙ තිෂ්ඨන්ති.
ඵලානි අපි පරාර්ථාය (භවන්ති.)
වෘක්ෂාඃ සත්පුරුෂාඃ ඉව.

ඡායාමන්‍යස්‍ය = ඡායාම් + අන්‍යස්‍ය.

ඡායා — (සෙවණ.) 'ආ'අන් ලද ලිඟු යි.

ඡායා ඡායෙ ඡායාඃ
ඡායාම් ,, ,,

අන්‍යස්‍ය — (අන්‍යට — පරා හට) රුව එක් ගිණි වුව ද බුනු අරුති.

සවයමාතපෙ = සවයම් + ආතපෙ.

සවයං — (තෙමේ, තුමූ) මේ හෙළ්‍රියෙකි (නිපාතයෙකි.)

ආතප — අව්ව 'අ'අත් පුසු ලිඟු යි. ආතපෙ (අව්වෙහි.)

එලාත්‍යපි = එලාති + පි.

අපි — ද පවා.

පරාර්ථාය = පර + අර්ථාය. පර වැඩට; අනුනට වැඩ සඳහා.

සත්පුරුෂාඃ — සුදනෝ.

ඉව — වැනි. හෙළ්‍රියෙකි (නිපාතයෙකි) හෙළිමෙයෙහි වනාහි 'මෙන්' 'වන්' යනාදි හෙළ්‍රි දෙ වන වර ගත් පදයක් හා මැ යෙයි.

කො තරම් මනහර කියමනෙක් ද? තෝරැම ඔබ ගේ මැ බසින් ලියන්නැ.

පාළිය

ඇබෑසිය

1. සකු ඇබෑසියේ සිවු වැන්න පෙරළුව මැනැවි පාළියට.
2. 'තදී' 'වධූ' දෙ සද පාළියට වර නඟන්නැ.
3. වුස (පැහැසීමෙහි,) වද (කීමෙහි,) හක්ඛය — හක්ඛෙ — (කෑමෙහි,) ජිගස (ඇඟැරුමෙහි,) ජප්ප (කීමෙහි,) පීඩය — පීඩෙ — (පෙළීමෙහි.)

   වර නැඟුව මැනැවි මේ පවතු අඟු පාළියට.
4. මෙ තෙක් උගත් වදන් යොදමින් පාළි කියමන් දහයක් ඔබ මැ ගොතන්නැ.
5. එ කියමන්වලැ සිංහිය පෙරළන්නැ.

6. සකු තව වැත්ත පාළියට හැරවුව මැනැවි.
7. සකු දස වැත්ත පාළියට පෙරළත්තැ.

රූකුල

සකු	පාළි
මද්‍යප	මජ්ජප
යොෂිතඃ	නාරියො ('නාරී' සද යැ.)
කුර්වන්ති	කුබ්බන්ති, කරොන්ති
ශීර්ෂ	සීස
මූර්ඛ	මූළ්හ
තෘණ	තිණ
සූර්‍ය	සූරිය
ස්වයම්	සයං

සකු වදන් පාළියට පෙරළන විටැ මේ ගුරු කම් සිතට ගන්නැ:—

(1) බැඳෙන 'ර' යන්න බැඳුණු අනෙක් අකුරේ රුව ගනී.

තර්ක = තක්ක ගර්භ = ගබ්භ
තක්‍ර = තක්ක අභ්‍ර = අබ්භ
පත්‍ර = පත්ත වර්ෂ = වස්ස
කර්ණ = කණ්ණ අශ්‍ර = අස්ස

(2) මහ පණ අකුරු දෙකක් වුව, මුල පුළු පණ වේ.

ගර්භ = ගභ්භ = ගබ්භ
අභ්‍ර = අභ්භ = අබ්භ

(3) පදය මුලැ තම බැඳුණු 'ර' යන්න හැර දමනු ලැබේ.

ක්‍රම = කම ශ්‍රමණ = සමණ

(4) 'ම්‍ර' යනු 'ම්බ' වෙයි.

ආම්‍ර = අම්බ තාම්‍ර = තම්බ

(5) 'ර්ණ' යනු 'ණ්ණ' වෙයි.

කර්ණ = කණ්ණ

(6) 'ද්‍ය' යනු 'ජ්ජ' වෙයි.

විද්‍යා = විජ්ජා

තද්‍යා = තජ්ජා

(7) 'ණ්‍ය' යනු ද 'න්‍ය' යනු ද 'ඤ්ඤ' වෙයි.

පුණ්‍ය = පුඤ්ඤ   ධන්‍ය = ධඤ්ඤ

'මුනි' සද

1. මුනි   මුනී, මුනියෝ
2. මුනිං   ,,   ,,

'චමූ' සද

1. චමූ   චමූ, චමූයො
2. චමූං   ,,   ,,

---

7. පැඳුම

ඇබෑසිය

1. ය, ඵ, ඛ, ඝ යන සතර සකු අකුරින් ලියා පුරුදු වන්නැ.
2. මෙය මේ තෙක් උගත් පිලි ගත්වා ලියන්නැ.
3. කොම්බුව, දෙ-කොම්බුව, කොම්බු ඇල පිල්ල, දෙ-කොම්බු ඇල පිල්ල යන පිලින් ගත්වා ලියන්නැ මෙ තෙක් උගත් හැම අකුරු.

4. මේ බැඳි අකුරු සකුයෙන් ලියන්නා. (හල් අකුර ද බැඳි සේ සලකන්නා.)

ස්‍ය, ග්‍ය, හ්‍ය, ම්‍ය, ට්‍ය, ඨ්‍ය, ඪ්‍ය, ද්‍ය, ජ්‍ය, ෂ්‍ය, ණ්‍ය, ය්‍ය, ථ්‍ය, ඝ්‍ය, ධ්‍ය, ස්ථ, ග්ධ, ද්ධ, ධ්ම.

5. ලියන්නා මේ වදන් සකු අකුරින්:—

පේෂණම්	(ඇඹැරීම)	ස්තූපඃ	(තුබ)
පේෂණී	(ඇඹැරුම් ගල)	ස්ථෛර්‍යම්	(තිර බව)
ප්‍රේම	(පෙම)	ධීර	(දිරි ඇති)
ඵේණඃ	(පෙණ)	ධූපඃ	(දුම)
ෂට්පදඃ	(බිඟුවා)	ධෛර්‍යම්	(දිරිය)
ෂණ්ඪඃ	(නපුංසකයා)	ධෝරණම්	(වාහනය)
ෂෂ්ඨ	(ස-වැනි)	ධෞරෙය	(දූරියා හැකි)
යුග්මම්	(දෙක)	රේඵඃ	(රෙඵය)
යුද්ධම්	(යුද)	රෝගඃ	(ලෙඩ)
යූථඃ	(එක් දූයෙකා සමූහය)	රෞද්‍ර	(රුදුරු)
යූථම්	(,,)	භෝගඃ	(සැපත)
මාර්ගස්ථ	(මඟ සිටි)	භෞමඃ	(අඟහරුවා)
ස්ථිර	(තිර)	පෝෂණම්	(පෙහෙණීම)
පෞරුෂම්	(පිරිමි කම)	ගද්‍යම්	(ගැදිය)
පෞෂ්ප්‍ය	(මලින් කළ)	පාඨ්‍ය	(පැටියා යුතු)
දෝෂඃ	(දොස)	රෞප්‍ය	(රිදියෙන් කළ)
දෞර්මනස්‍යම්	(දොම්නස)	භාෂ්‍ය	(කියයුතු)
ඝෝර	(ගොර)	පුණ්‍යම්	(පින)
ඝෞරම්	(ගොර බව)	පථ්‍ය	(හොඳ)
ධ්වංසඃ	(නැසීම)	ධ්‍යෙය	(මෙනෙහි කළ යුතු)
ඝටඃ	(කළය)	මධ්‍ය	(මැදි)
ඝණ්ටා	(ගෙඩිය, මිණිය)	මුග්ධ	(මෝඩ)
ඝෘණා	(දයාව)	සිද්ධ	(සිදු වූ)
පද්‍යම්	(පැදිය)	සාධ්‍ය	(සිදු කළ හැකි)

6. පුත්‍ර, හරි (විෂ්ණු,) විෂ්ණු යන පුසු ලිඟු නමු ද,
කාන්තා, රති, පුත්‍රී, ධෙනු, වධූ යන ලඳ නමු ද,
පාත්‍ර, දධි (දී,) මධු යන නිපුස් නමු ද වර නගන්නැ.

7. මම, අපි දෙ දෙන, අපි
මා, අප දෙ දෙනා, අප

තෝ, තෙපි දෙ දෙන, තෙපි
තා, තොප දෙ දෙනා, තොප

හේ, ඔහු දෙ දෙන, ඔහු
ඔහු, ඔවුන් දෙ දෙනා, ඔවුන්

ඕ, ඔහු දෙ දෙන, ඔහු
ඇය, ඔවුන් දෙ දෙනා, ඔවුන්

ඒ, එ දෙක, ඒවා
එය, එ දෙක, ඒවා

මේ අරුත් දෙන සකු පද ලියුව මැනැවි.

8. මෙ නෙක් දන්නා පවතු (ක්‍රියා) පද එක එක ගිණියෙන් පහක් බැගින් තෝරා, එක-එකෝ අසන කියන තැනි (මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ) රූ යොදන්නැ.

9. මේ සොලොව හෙළුවට පෙරළන්නැ:—

අලසස්‍ය කුතො විද්‍යා?
අවිද්‍යස්‍ය කුතො ධනම්?
අධනස්‍ය කුතො මිත්‍රම්?
අමිත්‍රස්‍ය කුතඃ සුඛම්?

රූකුල

අලසස්‍ය — අලසයා ගේ. අලසයාට.
කුතො (කුතඃ) — කොයින් (වේ ද?)
විද්‍යා — දැනුම.

අභ්‍යාසය — දැනුම තැත්තහු ගේ (තැත්තහුට.) විද්‍යාව යමකුට නො වේ ද, හේ අවිද්‍ය. මේ බඳු තන්හි අගැ ‘අ’ යන්න ලුහු වන සැටි බලන්නැ. ‘අලජ්ජ’ යනුත් විමසන්නැ.

විශයුරැව

	එක්.	දෙ.	බුහු.
1.	අහම් (මම)	ආවාම්	වයම්
2.	මාම් (මා)	,,	අස්මාන්
1.	ත්වම් (තෝ)	යුවාම්	යූයම්
2.	ත්වාම් (තා)	,,	යුෂ්මාන්

පුසු ලිඟු

1.	සඃ (හේ)	තෞ	තෙ
2.	තම් (ඔහු)	,,	තාන්

ලඳ ලිඟු

1.	සා (ඕ)	තෙ	තාඃ
2.	තාම් (ඇය)	තෙ	තාඃ

නිපුස් ලිඟු

1.	තත් (ඒ)	තෙ	තානි
2.	තත් (එය)	තෙ	තානි

පශ්‍ය (බැලීමෙහි)

ගැනෙන තැනි :	පශ්‍යති	පශ්‍යතඃ	පශ්‍යන්ති
අසන ,, :	පශ්‍යසි	පශ්‍යථඃ	පශ්‍යථ
කියන ,, :	පශ්‍යාමි	පශ්‍යාවඃ	පශ්‍යාමඃ

‘පශ්‍ය’ යනු පවතු අඟුව යි.

ගැනෙන :	— ති	— තඃ	— අන්ති
අසන :	— සි	— ථඃ	— ථ
කියන :	— මි	— වඃ	— මඃ

යනු යැ වරැ. සියත තැනී වර පර කලැ පෙර වැ සිටි 'අ' යන්න දිගු වේ.

පශ්‍ය + මි = පශ්‍යාමි

පශ්‍ය + වඃ = පශ්‍යාවඃ

පශ්‍ය + මඃ = පශ්‍යාමඃ

'අන්ති' වර පර කලැ පෙර වැ සිටි 'අ' යන්න ලොප් වේ.

පශ්‍ය + අන්ති = පශ්‍යන්ති

පැදි රසය

උගනිමු සොලොවක් :—

යථා විහඞ්ගාස්තරුමාශ්‍රයන්ති
තද්‍යො යථා සාගරමාශ්‍රයන්ති
යථා තරුණ්‍යඃ පතිමාශ්‍රයන්ති
සර්වේ ගුණාඃ කාඤ්චනමාශ්‍රයන්ති.

පෙරළමු හෙළුවට :—

සෙවිත් ද යම් සේ ගතසා කුරුල්ලෝ,
නදීහු මා මුද සෙවිත් ද යම් සේ,
සෙවිත් ද යම් සේ සැමියා ලියෝ'ලුත්,
කසුත් කොසුත් සෙවුති ගුණෝ සියල්ලෝ.

(ගතසා = රුක; ලියෝ + අලුත් = අලුත් ලියෝ — තරුණියෝ; කසුත් කොසුත් = කාඤ්චන කොෂයන් — රන් මලු.)

ලියමු ගැට-පදයක් :—

යථා — යම් සේ.

විහඞ්ගාඃ — කුරුල්ලෝ.

තරුම් — ගස.

ආශ්‍රයන්ති — සෙවිත්, ඇසුරු කෙරෙත්.

විහඞ්ගාඃ + තරුම් + ආශ්‍රයන්ති = විහඞ්ගාස්තරුමාශ්‍රයන්ති — සැදෑහුණු තැනුත් සැටිත් විමසන්නැ.

යථා විහඞ්ගාඃ තරුම් ආශ්‍රයන්ති (යම් සේ කුරුල්ලෝ ගස ඇසුරු කෙරෙත් ද)

නද්‍යෝ = නද්‍යඃ ('නදී' නමුව)

තරුණ්‍යඃ — තරුණියෝ. ('තරුණී' නමුව.)

පතිම් — පතියා; සැමියා.

සර්වේ — සියල්ලෝ.

කාඤ්චනම් — කාඤ්චනය; කසුන; රන. මෙහි ගැනෙනුයේ දනය යි.

ලොවැ අන් සියල්ල දනයට යට බව කී සැටි යි.
ඔබ ගේ මැ බසින් මෙහි අරුත ලියන්නැ.

පාළිය

ඇබෑසිය

1. සකු සිවු වැන්නේ බැඳි අකුරු පාළියෙහි කෙසේ සිටී ද?
2. පුත්‍ර, හරි, වෙණ්හු (විෂ්ණු) යන පුසු ලිඟු නමු ද, කන්‍යා, රති, පුත්‍රී, ධෙනු, වධූ යන ලඳ ලිඟු නමු ද, පත්‍ර, දධි, ලඝු යන නිපුස් නමු ද වර නඟන්නැ
3. සකු හත් වැන්න පාළියෙන් කරනු.
4. සකු අට වැන්න ද පාළියට හුරු කළ මැනැවි.
5. සොළෝ දෙක මැ නඟන්නැ පාළියට.

රුකුල

සකු	පාළි
විද්‍යා	විජ්ජා
විහඞ්ගාඃ	විහඞ්ගා
ආශ්‍රයන්ති	ආසයන්ති
තරුණ්‍යඃ	තරුණියො

සබ්බේ	සබ්බෙ
කාසාවතම්	කාසාවතං

වියසුරැම

1. අහං (මම)	මයං, අම්හෙ
2. මං, මමං (මා)	අම්හෙ, අම්හාකං
1. ත්වං, තුවං (තෝ)	තුම්හෙ
2. තං, තවං, තුවං (තා)	තුම්හෙ, තුම්හාකං
1. සො (හේ)	තෙ
2. තං (ඔහු)	තෙ
1. සා (ඕ)	තා, තායො
2. තං (ඇය)	තා, තායො
1. තං (ඒ)	තෙ, තානි
2. තං (එය)	තෙ, තානි

'පස්ස' පවතු අගුව

1. පස්සති	පස්සන්ති
2. පස්සසි	පස්සථ
3. පස්සාමි	පස්සාම

---

8. පැදුම

ඇබෑසිය

1. ච, ඛ, ඣ, ඪ සතු අකුරින් ලියුව මැනැවි.
2. මෙ තෙක් උගත් පිලිත් ගැන්වුව මැනැවි එ සතරට.
3. ලියන්නැ සතු අකුරින් මෙ තැනුත්:—

ක්ක, ක්ත්‍ර, ක්ප, ක්‍ය, ක්ම, ක්ව,
ඛ්‍ය, ඛ්ව, ස්ව, ම්ව, ම්බ, ද්ව,
ද්ධ, ෂ්ව, ණ්ව, ධ්ව, ස්ක, ෂ්ක,
ස්ඛ, ක්ෂ, ක්ෂ්ණ, ක්ෂ්ම, ක්ෂ්ව,
ක්ෂ්ණ්‍ය, ක්ෂ්ම්‍ය,

(හල් අකුරු බැඳියේ සලකන්න.)

4. මේ වදන් සකු අකුරින් ලියන්න:—

ඪක්කා	(උඩැක්කිය)	වාක්පථම්	(වදන් මග)
දේවඃ	(දෙවියා)	ව්‍යාඛ්‍යා	(සත්තය)
දෛවම්	(වාසනාව)	කාව්‍යම්	(කව)
භෛරවම්	(බිය)	ක්‍රමඃ	(පිළිවෙළ)
වෛරම්	(විරුද්ධ බව)	වාක්‍යම්	(කියමන)
වේෂං	(වෙස)	පක්ව	(පැසුණු)
විද්‍යා	(දැනුම)	ස්වකීය	(සිය)
වෛද්‍යඃ	(වෙදා)	සම්බෝධිඃ	(බුදු බව)
බෝධිඃ	(බෝධිය)	ද්වයම්	(දෙක)
කෛරවම්	(කුමුදුව)	ධ්වංසඃ	(නැසුම)
කෝටරඃ	(රුක් බිලය)	සංස්කාරඃ	(සැකැසුම)
කෝටරම්	(,,)	පුෂ්කරම්	(නෙළුඹ)
කෞමුදී	(සඳ රැස)	ක්ෂමා	(කමාව)
ඛේටඃ	(ග්‍රහයා)	සූක්ෂ්ම	(සියුම්)
ඛෝරඃ	(කොරා)	සෞක්ෂ්ම්‍යම්	(සියුම් බව)

5. දෙව, අරි (සතුරා,) රිපු (සතුරා) භ්‍රාතෘ, මරුත් (දෙවියා) යන පුරුෂ ලිඟු නම් ද,

ඪක්කා, කීර්ති, තරුණී, තනු (සිරුර,) ශ්වශ්‍රෑ (නැන්දා,) දුහිතෘ (දූ) යන ළඳ ලිඟු නම් ද,

කාව්‍ය, සුරභි (සුවඳ,) වස්තු, ජගත් (ලෝකය) යන නපුස් නම් ද වර නගන්න.

6 පච (පැචුමෙහි), ආප්ලෘද (පිනැවීමෙහි) ගමිජ (යාමෙහි,) ආගමිජ (ඊමෙහි)

මේ ධාතු අනු වර නගන්න.

7 නගන්න සකුවට —

කව පචමි මම.
තො ද කව පචති
සේ කව නො පචසි
තො ද මම ද කව පචමු.
ඔහු ද තෙ ද මම ද කව පචමු.
අපි දෙ දෙන කව ලියමු.
ඔහු නො ලියති කව්.
දෙවියෝ මිනිසුන් රකිති.
මම ඩැක්කි දෙක දකිමි.
කොරා නො එයි.

8. සකු කියමන්හි ගිණිය පෙරළන්න.

9. හෙළුවට නගන්න.

පිබන්ති නද්‍යඃ ස්වයමෙව නාම්භඃ
ස්වයං න ඛාදන්ති ඵලානි වෘක්ෂාඃ
නාදන්ති සස්‍යං ඛලු වාරිවාහාඃ
පරොපකාරාය සතාං විභූතිඃ.

විමසුව

තත් (ත් + අත් = 'ත'කාරාන්ත) පුසු විපශ්චිත්' (පඬුවා) නමුව

1.	විපශ්චිත්	විපශ්චිතෞ	විපශ්චිතඃ
2.	විපශ්චිතම්	,,	,,

තත් ලද 'සරිත්' (ගඟ) නමුව
එ සේ මැ යැ.

තත් නිපුස් 'ජගත්' (ලොකය) නමුව

1. ජගත් ජගතී ජගන්ති
2. ,, ,, ,,

සොලෝ ගැට-පදය

පෙල ගැස්ම

තද්‍යඃ අම්භඃ ස්වයං එව න පිබන්ති.
වෘක්ෂාඃ ඵලානි ස්වයං න ඛාදන්ති.
වාරිවාහාඃ සස්‍යං න අදන්ති ඛලු
සතාං විභූතිඃ පරෝපකාරාය

අම්භඃ — දිය. 'අම්භස්' (නි.) නමුව.
ස්වයම් — (හෙළිය — නිපාතය) තෙමේ, තුමූ.
ස්වයං එව — තෙමේ මැ, තුමූ මැ.
වාරිවාහාඃ — (පු.) මෙඝයෝ, වලා. වාරි (දිය) වහනුයේ (උසුලනුයේ) 'වාරිවාහ' යි. වලා කුළට නම්.
සස්‍යං — (නි) ගොයම.
අදන්ති — කති. 'අද්' පවතු අගුව අන්ති අතනඃ අදන්ති.
ඛලු — (හෙළිය — නිපාතය) මැ. න අදන්ති ඛලු — නො කත් මැ යි.
සතාං — සුදනන් ගේ; සත්පුරුෂයන් ගේ. 'සත්' (පු.) නමුව.
විභූතිඃ — සැපත. ඓශ්වර්යය. 'විභූති' (පු) නමුව.
පරෝපකාරාය — (පර + උපකාරාය) පර වැඩ පිණිසැ.

උගනිමු තවත් සොලොවක්:—

කවිඃ කරෝති පද්‍යානි.
ලාලයත්‍යුත්තමො ජනඃ.
තරුඃ ප්‍රසූතෙ පුෂ්පාණි,
මරුද්වහති සෞරභම්

2. පඨ, ආභිලාදය, ගවජ, ආගවජ යන පවතු අගු වර තනන්නැ.

3. සකු 7 වැන්න පාළියට පෙරළන්නැ.

4. සකු සිලෝ දෙක මැ පාළියට පෙරළන්නැ.

රුකුල

සකු	පාළි
සවයං	සයං
අම්භස්	අම්බු
වෘක්ෂ	රුක්ඛ
සස්‍ය	සස්ස
සතතං	සතං, සන්තතං
පද්‍ය	පජ්ජ
ප්‍රසූතෙ	පසූතෙ, පසවති
පුෂ්ප	පුප්ඵ
සෞරභ	සුරභි

පාළියෙහි හලන් (හලන්ත) වදන් නැති.

හලන් සකු වදනක් වූ කලැ, එය සඳහා සම'රුත් පාළි වදන තෝර-ගත යුතු.

සකු	පාළි
විපශ්චිත්	පණ්ඩිත (පු.)
මරුත්	මාලුත (පු.)
ජගත්	ලොක (පු.)
අම්භස්	අම්බු (නි.)
සත්	සන්ත
යොෂිත්	නාරී

9. පැදුම

ඇබෑසිය

1. ච, ජ, ඤ, ඒ, ඓ, උ, ඌ යන මෙය සකු අකුරින් ලියුව මැනැවි.
2. මෙ තෙක් උගත් පිළිත් සුදුසු සේ ගන්වන්නැ.
3. ලියන්නැ සකු අකුරින් මේ තැනුත් :—
   චච, චය, ජජ, ජ්ච, (ජ්ඤ) ඥ, ජ්‍ය, ශ්‍ර, ඤච, ඤ්ජ.
4. මේ තැන් සකු අකුරින් ලියන්නැ.

චාමරම්	(සෙමෙර)	උග්‍ර	(දරුණු)
රාජා	(රජ)	උච්ච	(උස්)
එක	(එක්)	උෂ්ණ	(හුණු)
එණ:	(මුවා)	උච්චාරණම්	(හැඬැවීම)
එණී	(මුව දෙන)	ඌන	(අඩු)
එව	(මැ)	ඌරු:	(කලවය)
එවම්	(මෙ සේ)	ඌර්මි:	(රළ)
ඓරාවණ:	(එ නම් ඇතා)	ඌර්ධ්ව	(උඩු)
වාච්‍ය	(කියැ යුතු)	විඥ:	(විශේෂයෙන් දන්නේ)
රාජ්‍යම්	(රජය)	ධර්මඥ:	(දහම් දන්නේ)
ජ්වර:	(උණ)	වජ්‍ර:	(විදුරු'මිය)
මජ්ජා	(ඇට මිදුළු)	කඤ්චුක:	(කස්ස)
ප්‍රඥා	(පැන)	පඤ්ජර:	(මැදිරිය)

5. ඓරාවණ, මුනි, ඌරු, භූභෘත් (පර්වතය) යන පුප ලිඟු නම් ද,
   ප්‍රඥා මති (නුවණ,) එණී, ශරද් (සරා කල) යන ළඳ ලිඟු නම් ද,
   චාමර, ශුචි (පිරිසුදු,) මධු (මී) යන නිපුස් ලිඟු නම් ද වර නඟන්නැ.
6. නම (වැදිමෙහි,) අධ්‍යාපය (ඉගැන්වීමෙහි,) ස්නිහ්‍ය (සෙනෙහෙ කිරීමෙහි) ක්‍රියාඞ්ග වර නඟන්නැ.

7. නගන්නැ සකුවට :—

එක් මිනිසෙක් එක් ගැහැනියක දකී.
බාලයෝ දෙ දෙන එක් ගෙඩියක් කති.
මුවා ද මුව දෙන ද තණ කොළ කති.
මම පැදි (පද්‍ය) දෙකක් උගනිමි.
තෙපි ලියනු දිග පොත.
ඓරාවණයෝ දෙ දෙනෙක් නො වෙති.
ඇතෙකි ඓරාවණයා.
අපි යමු ගඟට.
තෝ පොත නො පටනී.
ඇත්තු මස් නො කති.

8. සකු කියමන්හි ගිණිය පෙරළන්නැ.

9. හෙළුවට නඟන්නැ.

ආපාණ්ඩුරාඃ ශිරසිජාස්ත්‍රිවලී කපොලෙ
දන්තාවලී විගලිතා න ච මෙ විෂාදඃ
එණීදෘශො යුවතයඃ පථි මාං විලොක්‍ය
තතෙතිභාෂණපරාඃ ඛලු වජ්‍රපාතඃ

විමසුව

1.	සුරඃ	සුරෞ	සුරාඃ
2.	සුරම්	,,	සුරාන්

මෙ තන්හි 'සුර' නමුව යි. වරැ (විබෙදු) කවරේ ද?

1.	ඃ	ඖ	අඃ
2.	ම්	ඖ	අන්

යැ යි ගත හැකි.

1.	මරුත්	මරුතෞ	මරුතඃ
2.	මරුතම්	,,	මරුතඃ

මෙහි 'මරුත්' නමුව යි.

1. —	ඔ	අඃ
2. අම්	ඔ	අඃ

දෙ-බිඳුව (විසර්ගී) 'ස්' යන්න සඳහා ආයේ ය. එ හෙයින් මේ යැ වරු :—

ස්	ඖ	අස්
අම්	ඖ	අස්

'ස්' යනු කියැවීමේ පහසුවට 'සු' යැ යි ගනිමු.
'ඖ' 'ඖ' යන දෙකින් දෙ වැන්න 'ඖට්' යැ ගනිමු.
'අස්' 'අස්' යැ යි දෙකක් වන බැවින් පළමු වැන්න 'ජස්' යැ යි ද දෙ වැන්න 'ශස්' යැ යි ද ගනිමු.
එකතු කළ අකුරුවලින් ඇත්තේ කියැවීමේ පහසුවත් එක එක වෙන් කොටැ ගැනීමේ පහසුවත් පමණ යැ.
මේ පාණිනි මහ රුසියාණන් වරු දක්වූ සැටි යි. අපිත් එ සේ මැ ගනිමු.

සු	ඖ	ජස්
අම්	ඖට්	ශස්

මෙයින් ගත යුතු,

ස්	ඖ	අස්
අම්	ඖ	අස්

යනු මැ පමණක් බව මතක තැබී තොකරන්නැ.
වරු යෙදෙන සැටි බලමු.

සුර + සු = සුර + ස් = සුරස් = සුරඃ
(අගැ 'ස්' සියලු විටැ 'ඃ' වෙයි.)

සුර + ඖ = සුරෞ (අ + ඖ = ඖ)
සුර + ජස් = සර + අස් = සුරාඃ (අ + අ = ආ)
සුර + අම් = සුරම් ('අ' ලොප් වේ.)
සුර + ඖට් = සුර + ඖ = සුරෞ
සුර + ශස් = සුර + අස් = සුර + අන් = සුරාන්

පුසු සරන් (සවරාන්ත) නමු කෙරෙන් පර වූ 'ශස්' වරුයේ 'ස්' යන්නට 'න්' යන්න මාරු වෙයි. අන් කිසි තැනෙකැ ඒ නො වේ.

1.	හරිඃ	හරී	හරයඃ
2.	හරිම්	හරී	හරීන්
1.	ගුරුඃ	ගුරූ	ගුරවඃ
2.	ගුරුම්	ගුරූ	ගුරූන්

'ඉ' 'උ' අන් පුසු නමු කෙරෙන් පර වූ 'ඖ' ද, 'ශස්' වරුයේ 'අ' යන්න ද පෙර රූ ගනී.

හරි + ඖ = හරි + ඉ = හරී (ඉ + ඉ = ඊ)

ගුරු + ඖ = ගුරු + උ = ගුරූ (උ + උ = ඌ)

හරි + ශස් = හරි + අන් = හරි + ඉන් = හරීන්

ගුරු + ශස් = ගුරු + අන් = ගුරු + උන් = ගුරූන්

'ජස්' වරුව පර කලැ පිසු නමු 'ඉ' 'අය්' වෙයි, 'උ' 'අව්' වෙයි.

හරි + ජස් = හරය් + අස් = හරයඃ

ගුරු + ජස් = ගුරව් + අස් = ගුරවඃ

'ඉ' 'උ' කෙරෙන් පර වූ 'අම්' වරුයේ 'අ' ද ලොප් වෙයි.

හරි + අම් = හරිම්

ගුරු + අම් = ගුරුම්

සොලෝ ගැට-පදය

ශිරසිජාඃ ආපාණ්ඩුරාඃ.
කපොලෙ ත්‍රිවලී
දන්තාවලී විකලිතා
ච මෙ විෂාදඃ ත

එණීදෘශඃ යුවතයඃ පථි මාං විලෝක්‍ය 'තාත'
ඉති භාෂණපරාඃ.

වජ්‍රපාතඃ බලු.

ශිරසිජාඃ -- කෙශයෝ. කෙස්. ශිරස්හි (හිසෙහි) ජාත වූ (උපන්) හෙයින් කෙස 'ශිරසිජ' නම්. බුහු ගිණියැ 'ශිරසිජාඃ' යනු යි.

ආපාණ්ඩුරාඃ -- හොඳට මැ සුදු 'භවන්ති' (වෙති) යි වටහාः- ගත යුතු. 'පාණ්ඩුර' = සුදු. ආපාණ්ඩුර = හොඳට මැ සුදු.

කපෝලෙ — කොපුලෙහි. කම්මුලෙහි.

ත්‍රිවලී — තුන් රැළිය. 'භවති' යි වටහාः-ගත යුතු. මහලු වූ කලැ කම්මුලෙහි රැළි තුනෙක් පෙනේ.

දන්තාවලී = දන්ත + ආවලී — දත් පෙළ.

විගලිතා — ගිලිහුණී. වැටුණී. ඇයි ළඳ ලිඟු?

ච — එහෙත්.

මෙ — මට.

විෂාදඃ — සාවෙක්. ශොකයෙක්.

න — 'භවති' යි වටහා-ගන්නැ. නො (වේ.)

එණීදෘශඃ යුවතයඃ — මුවලැසි තරුණියෝ. එණීන් ගේ (මුව දෙනුන් ගේ,) වන් 'දෘශ්' (ඇස්) ඇත්තෝ 'එණීදෘශ්' නම් වෙති. බුහු ගිණියැ 'එණීදෘශඃ'.

පථි — මඟැ. මඟැ දී.

මාං — මා.

විලෝක්‍ය — දැකැ.

'තාත' ඉති — 'පියාණෙනි' යි. 'තාත්තේ' යැ යි.

භාෂණපරාඃ — කියන සුල්ලෝ යැ. කියනු කැමැත්තෝ යැ.

වජ්‍රපාතඃ බලු — (එ නම්) හෙණ ගැසීමෙක් මැ යි. හෙණ පාත් වීමෙක් මැ යි.

මහ මහල්ලකු සිය සිතේ දුක පැවැසූ සැටි යි.

උගනිමු තව සොලොවක්.—

කමලා කමලෙ ශෙතෙ,
හරඃ ශෙතෙ හිමාලයෙ,
ක්ෂීරාබ්ධෞ ච හරිඃ ශෙතෙ,
මන්‍යෙ මත්කුණශඞ්කයා.

තගමු හෙළුවට:—

කමල් හොවී කමල් ගජ්හි
හිමවත්හි හරා හොවී.
හොවී හොවිඳු පා මූදේ.
මකුණන් බියෙනැ යි හගිමි.

කමලා — සිරි කත.

කමලෙ — පියුමෙහි.

ක්ෂීරාබ්ධෞ — (ක්ෂීර = කිරි, අබ්ධි = මූද) කිරි මූදේ (පා = කිරි.)

මන්‍යෙ — හගිමි. සිතමි.

මත්කුණ-ශඞ්කයා — මකුණන් (වෙති යි) සැකයෙන්.

සොලොවේ අරුත් ලියුව මැනැවි.

පාලිය

ඇබෑසිය

1. ඒරාවණ, මුනි, උඟරු යන පුසු ලිඟු නමුත්,
පඤ්ඤා, මති, එණි යන ළඳ ලිඟු නමුත්,
චාමර, සුචි, මධු යන නිපුස් නමුත් වර නගන්නැ.

2. තම, අජඩාපය, සිත්ය්ත යන පවතු අඟු ද වර තගන්නෑ.
3. සකු හත් වැන්තේ කියමන් පාළියට පෙරළන්නෑ.
4. එ පාළි කියමන්වලෑ ගිණිය පෙරළන්නෑ.
5. සොලෝ දෙක මැ පාළියට හරවන්නෑ.

රූකුල

සකු	පාළි
ආපාණ්ඩුර	ආපණ්ඩුර
විෂාද	විසාද
එණීදෘශඃ	එණීතයතා
පටි	මගෙග
මාං	මං
විලොකාය	විලොකිය
වජ්‍රපාතඃ	වජිරපාතො
ක්ෂීරාබ්ධෞ	ඛීරණ්ණවෙ
මත්‍යා	මඤ්ඤා
මත්කුණශබ්ඛායා	මක්කුණසඛාය

---

10. පැදුම

ඇබෑසිය

1. ත, ත, අ, අං, ඕ, ඖ යන මෙය සකු අකුරින් ලියන්නෑ.
2. ත, ත දෙකට ගන්වන්නෑ මෙ තෙක් උගත් පිලින්.
3. මෙ තැනුත් සකු අකුරින් ලියන්නෑ.

    තත, තත, තත, කත, කත්‍ර, සත, නත, න්ද, න්ධ, ත්‍ය, න්ථ, න්ත්‍ර, ත්‍ර්‍ය, ස්ත්‍ය, න්ත්‍ර්‍ය, ස්ත්‍ර, ත්ම්‍ය, ග්හ්‍ය, ද්හ්‍ය, ද්ව, ද්බ්‍ර, ශ්ච්ව, න්ත්‍ය, න්ද්‍ය, ද්ධ්‍ය.

(හල් අකුරු වුව ද බැඳි සේ සැලෑකුව මැනැවි.)

2. නම, අජ්ඣාපය, සිතිය්හ යන පවතු අඟු ද වර නගන්නැ.
3. සකු හත් වැන්නේ කියමන් පාළියට පෙරළන්නැ.
4. එ පාළි කියමන්වලැ ගිණිය පෙරළන්නැ.
5. සොළෝ දෙක මැ පාළියට හරවන්නැ.

රැකුල

සකු	පාළි
ආපාණ්ඩුර	ආපණ්ඩුර
විෂාද	විසාද
එණීදෘශඃ	එණීනයනා
පවි	මෙඝ
මාං	මං
විලොක්‍ය	විලොකිය
වජ්‍රපාතඃ	වජිරපාතො
ක්ෂීරාබ්ධෞ	ඛීරණ්ණවෙ
මර්ත්‍ය	මච්ච
මත්කුණශඛායා	මක්කුණසඛාය

---

10. පැදුම

ඇබෑසිය

1. ත, න, අ, අං, ඕ, ඖ යන මෙය සකු අකුරින් ලියන්නැ.
2. ත, න දෙකට ගන්වන්නැ මෙ තෙක් උගත් පිළිත්.
3. මෙ තැනුත් සකු අකුරින් ලියන්නැ.

   ත්ත, න්න, ත්‍ථ, ක්ත, ක්‍ර, ස්ත, න්ත, න්ද, න්ධ, ත්‍ය, ත්ව, න්ත්‍ර, ත්‍ර්‍ය, ස්ත්‍ය, න්ත්‍ර්‍ය, ස්ත්‍ර, ත්ම්‍ය, ග්භ්‍ය, ද්භ්‍ය, ද්ව, ද්බ්‍ර, ශ්ච්ව, න්ත්‍ය, න්ද්‍ය, ද්ධ්‍ය.

(හල් අකුරු වුව ද බැඳි සේ සැලැකුව මැනැවි.)

4. ලියන්නැ සකු අකුරින් මේ වදනුත් :—

තාතඃ	(පියා)	ආසනම්	(අස්න)
සීතා	(සීතාව)	ඔතුඃ	(බළලා)
තෘණම්	(තණ)	ඔෂ්ඨඃ	(තොල)
නාථඃ	(නායකයා)	ඖෂධම්	(ඔසුව)
නානා	(නොයෙක්)	ඖර්ණී	(ලොමින් කළ)
අනාථ	(අසරණ)	චින්තනම්	(සිත)
උත්පන්න	(උපන්)	යන්ත්‍රඃ	(යතුර)
යත්නඃ	(තැත)	අගස්ත්‍යඃ	(අගතිසි)
මුක්තා	(මුතුව)	වස්ත්‍රම්	(වත)
අත්‍ර	(මෙහි)	දෘෂ්ට්වා	(දැකැ)
ත්‍රස්ත	(තැති ගත්)	අන්ත්‍ය	(කෙළවර)
දන්තඃ	(දත)	මාන්ද්‍යම්	(මඳ බව)
මන්ද	(මඳ)	උත්පතනම්	(උඩ පිනීම)
අන්ධ	(අඳ)	මත්ප්‍රීතිඃ	(මගේ ප්‍රීතිය)
මන්ථර	(ලැසි)		

5. ‘අ’ ‘ඉ’ ‘උ’ ‘ඍ’ අන් පුසු ලිඟු නිපුස් ලිඟු නමුව බැගින් ද,

‘ආ’ ‘ඉ’ ‘ඊ’ ‘උ’ ‘ඌ’ ‘ඍ’ අන් ඉතිරි ලිඟු නමුව බැගින් ද වර නගන්නැ.

6. යාම, ඊම, සිටීම, හිඳීම, දෙඩීම, ඉගැනීම යන අරුත් හඟවන පවතු අගුව බැගින් වර නගන්නැ. (‘උපවිශ’ හිඳීමෙහි පවතු අගු යි.)

7. (1) ……… අත්‍ර උපවිශාමි.
(2) ත්වං ………………………
(3) ……… අත්‍ර උපවිශති.
(4) ………… උත්තිෂ්ඨන්ති.
(5) වයං ………………
(6) …………… උත්තිෂ්ඨ.
(7) අජාඃ ………… න ඛාදන්ති.

(8) .... බාලෙෂ හවාමඃ.

(9) ශුවාමි ....

(10) .... හවතඃ

අඩු තැන් පුරවන්නැ.

8. හෙළුවට නඟන්නැ.

අර්ථාතුරාණාං න ගුරුර් බන්ධුඃ.
කාමාතුරාණාං න හයං න ලජ්ජා.
විද්‍යාතුරාණාං න සුඛං න නිද්‍රා
ක්ෂුධාතුරාණාං න රුචිර් වෙලා

9. මේ සිලෝව සකු අකුරින් ලියන්නැ. 'ල' යන්න යෙදුණු තැන්හි පමණක් ලියන්නැ හෙළු 'ල' යන්න මැ.

වියයුරුව

තුන් වන වර:

සකුයෙහි තුන් ගිණියට යෙදෙන්නේ,

ටා හ්‍යාම් හිස්

යන වරු තුන යැ.

'ටා' යන්නෙන් ගැනෙනුයේ 'ආ' පමණ යි. 'ට්' යනු දැක්වීමේ පහසුව සඳහා යෙදිණ. 'ආ' යන්න පමණෙක් ගැනිණි නම්, සැඳැහුණු තැන්හි වරු රුව පැහැදිලි ලෙස නො පෙනේ.

ආ හ්‍යාම් හිස්

යනු යැ නියම වරු රූ.

ටා = ආ

(1) 'අ' යන්නෙන් පර කලැ 'ඉන' වෙයි.

බාල + ටා = බාල + ආ = බාල + ඉන = බාලෙන

(සකුයෙහි 'අ + ඉ' 'ඒ' වෙයි.)

(2) පුසු නිපුස් 'ඉ' 'උ' දෙකින් පර කලැ 'නා' වෙයි.

කපි + ටා = කපි + ආ = කපිනා

මධු + ටා = මධු + ආ = මධුනා

(3) නිපුස් 'ඍ' යන්නෙන් පර කලැ ද 'නා' වෙයි.

කත්‍රී + ටා = කත්‍රීණා.

(4) 'ආ' යන්නෙන් පර කලැ නමූයේ 'ආ' 'අය්' වේ.

බාලා + ටා = බාලා + ආ = බාලය් + ආ = බාලයා.

(5) සෙසු තන්හි නියම සැඳැහීම වේ.

මති + ටා = මති + ආ = මත්‍යා ('ඉ' 'ය්' වෙයි)

නදී + ටා = නදී + ආ = නද්‍යා ('ඊ' ද 'ය්' වෙයි.)

ධෙනු + ටා = ධෙනු + ආ = ධෙන්වා ('උෂ' 'ව්' වෙයි.)

වධූ + ටා = වධූ + ආ = වධ්වා ('ඌ' ද 'ව්' වෙයි.)

පිතෘ + ටා = පිතෘ + ආ = පිත්‍රා ('ඍ' 'ර්' වෙයි.)

යෝෂිත් + ටා = යෝෂිත් + ආ = යොෂිතා

භ්‍යාම්

වෙනසකට නො යේ පෙර 'අ' යන්න දිගු වෙයි.

බාල + භ්‍යාම් = බාලාභ්‍යාම්

බාලා + ,, = බාලාභ්‍යාම්

ගිරිභ්‍යාම්, ගුරුභ්‍යාම්, නදීභ්‍යාම්, වධූභ්‍යාම්, පිතෘභ්‍යාම්, යෝෂිද්භ්‍යාම් යනාදිය ද විමසන්නැ.

යොෂිත් + භ්‍යාම් = යොෂිද්භ්‍යාම්

ගොස'කුර පර කලැ, අගොස'කුර ද ගොස වේ 'ත්' යනු ගොස යි. එ හෙයින් 'ත්' යන අගොස'කුර ගොස වැ 'ද්' වේ.

භිස්

(1) 'අ' යන්නෙන් පර කල්හි 'ඓස්' වෙයි.

බාල + භිස් = බාල + ඓස්

= බාලෛස් (අ + ඓ = ඓ)

= බාලෛඃ.

(2) සෙසු තන්හි වෙනස් නො වේ.

බාලා + භිස් = බාලාභිඃ. ගිරිභිඃ, ගුරුභිඃ, නදීභිඃ, වධූභිඃ, කර්තෘභිඃ, මරුද්භිඃ යනාදිය ද විමසන්නු.

අරුත

බාලෙන	— බාලයා විසින්; .... කරණ කොට
බාලාභ්‍යාම්	— දෙ බාලයන් විසින්; ,, ,, ,,
බාලෛඃ	— බාලයන් ,, ,, ,, ,,
වනෙන	— වනයෙන්

සොලොස් ගැට-පදය

අර්ථාතුරාණාම් — අර්ථය (ධනය — වස්තුව) නිසා ආතුර (ලෙඩ) වූවනට.

ගුරුඃ — ගුරෙක්.

න — නො (වේ.)

(ගුරුඃ + න = ගුරුර්න සැදෑ ගීම යි.)

බන්ධුඃ — නෑයෙක්.

කාම — රාගය.

විද්‍යා — දැනුම.

ක්‍ෂුධා — සා ගින්න.

රුචිඃ — රිස්සෙක්.

වෙලා — වේලාවෙක්.

තව ද සොලොවක් උගතිමු.

අමන්ත්‍රමක්ෂරං නාස්ති.
නාස්ති මූලමනෞෂධම්.
අයෝග්‍යඃ පුරුෂෝ නාස්ති.
යෝජකස්තත්‍ර දුර්ලභඃ.

නගමු හෙළුවට.

මතුරක් නූ'කුරෙක් නැත්තේ.
නැත්තේ යැ නොබෙහෙත් මුලෙක්.
නොමනා පුරිසෙක් නැත්තේ.
යෙදුවා නම් දුලුප් යැ ඊ.

(දුලුඹු = දුලුබ් = දුලුප් — දුර්ලභ.)

අමන්ත්‍රම් (මතුරෙකැ නොයෙදෙන) අක්ෂරං න අස්ති. අනෞෂධං (ඔසුවට නොගැනෙන) මූලං (මුලෙක්) න අස්ති. අයෝග්‍යඃ (යම් කිසි කටයුත්තෙකැ යෙදියැ නො-හැකි) පුරුෂඃ න අස්ති. තත්‍ර (එහි) යෝජකඃ (යොදන්නා) දුර්ලභඃ.

පාළිය

ඇබෑසිය

1. සකු 5 වැන්න පාළියෙන් කරන්නැ
2. සකු ස-වැන්න පාළියෙන් කරන්නැ.
3. සකු සත් වැන්න පාළියෙන් කරන්නැ.
4. සිලෝ දෙක මැ පෙරළුන්නැ පාළියට.

රුකුල

සකු	පාළි
අක්ෂි	අක්ඛි
නිද්‍රා	නිද්දා
ක්ෂුධා	ඛුධා
අයෝග්‍ය	අයෝගිය

11. පැදුම

ඇබෑසිය

1. ල, ඣ, ඡ යන මෙය සකු අකුරින් ලියන්නැ.
2. ල, ඡ දෙක පිළි ගන්වා ලියන්නැ.
3. ලියන්නැ මේ තැනුත් සකු අකුරින් මැ :—

   ල්ල, ල්‍ය, ල්ක, ල්ග, ල්ප, ල්බ, ල්ම, ල්ව, ක්ල, ග්ල, ප්ල, ම්ල, ච්ඡ, ඤ්ඡ.

   (හල් කළ තැන් ද බැඳි සේ සලකන්නැ.)

4. මේ වදනුත් සකු අකුරින් ලියන්නැ :—

ලඞ්කා		ඡායා	(සෙවණ)
ලීලා	(ලීලාව)	ඡෙක	(දක්ෂ)
උලූකඃ	(බකමූණා)	උල්ලාසඃ	(උලෙළ)
ලුප්ත	(මැකූ)	අල්ප	(සුළු)
ලිප්ත	(ගෑ)	තුල්‍ය	(සම)
ලෝකඃ	(ලෝව)	වල්කලඃ	(වැහිරු)
විලෙපනම්	(විලෙවුන)	ගුල්මඃ	(එ නම් රෝගය)
ඡාගඃ	(එළුවා)	වල්ගිතම්	(ගමන)
උච්ඡින්න	(සුන් කළ)	පල්වලඃ	(දිය වළ)
උච්ඡූන	(ඉදිමුණු)	වික්ලවම්	(වියවුල් බව)
ප්ලවඞ්ගඃ	(වඳුරා)	ග්ලානි	(ගිලන් බව)
විප්ලවඃ	(පෙරළිය)	සඤ්ඡන්න	(හොඳට වැසුණු)
ම්ලාන	(මැලැවුණු)	ඣකාරඃ	('ඣ' යන්න)
ම්ලෙච්ඡඃ	(වන-සරුවා)	කෟප්ත	(කරන ලද)

5. 1 වැනි 2 වැනි 3 වැනි වරු පාණිනීන් කියූ සැටියට පෙන්වන්නැ. තියම වරු රූ කවරේ ද?
6. එක එක නමු වෙසෙසට මේ වරු රූ යෙදෙන සැටි පහදන්නැ.
7. මේ තැන් සඳහන්නැ:—

   අහං + ආගච්ඡාමි =

දෙව	+	අභිගතා	=
මූල	+	ආසනම්	=
මුනි	+	ඉන්ද්‍රඃ	=
මුනි	+	ඊශ්වරඃ	=
දේවී	+	ඉච්ඡා	=
දේවී	+	ඊශඃ	=
ගුරු	+	උත්තමඃ	=
දෙව	+	ඉන්දඃ	=
ලඞ්කා	+	ඉන්ද්‍රඃ	=
සුර	+	ඊශ්වරඃ	=
ලඞ්කා	+	ඊශ්වරඃ	=
එක	+	එකම්	=
දෙව	+	ඓශ්වර්‍යම්	=

එක් එක් තන්හි වූයේ කිමෙක් දැයි පැහැදියැ යුතු.

8. පෙරළන්නැ හෙළුවට:—

කාව්‍යසෙවාවිනොදෙන
කාලො ගච්ඡති ධීමතාම්,
ව්‍යසනෙන ච මූර්ඛාණාං
නිද්‍රයා කලහෙන වා.

9. සිලොව සකු අකුරින් ලියන්නැ.

වියසුරුව

නාමු වරැ (නාම විභක්ති)

1.	සු	ඖ	ජස්
2.	අම්	ඖට්	ශස්
3.	ටා	භ්‍යාම්	භිස්
4.	ඞෙ	භ්‍යාම්	භ්‍යස්

'ඬෙ'

මෙහි 'ඬ' යනු නිකම් යෙදුණෙකි. එ හෙයින් නියම වරුව 'ඒ' යනු යි.

'අ' යන්තෙන් පර 'ඬෙ' 'අය' වෙයි.

බාල + ඬෙ = බාල + ඒ = බාල + අය = බාලාය
ජල + ඬෙ = ජලාය

'ඬෙ' පර කලැ පුසු ලිඟු 'ඉ' 'අය්' වෙයි.
'උ' 'අව්' ,,

කපි + ඬෙ = කපි + ඒ = කපය් + ඒ = කපයේ.
ගුරු + ඬෙ = ගුරු + ඒ = ගුරව් + ඒ = ගුරවේ.

ආ — ඉ — ඊ — උ — ඌ — යන සරුවෙකින් අත් වන ළඳ ලිඟු නමුවකට 'ඬීත්' වරුවක් යෙදෙන කලැ,

(1) මැද්‍ද 'අ' ආගමය වේ,

(2) නමුයේ 'ආ' යන්තත් ආගම 'අ' යන්තත් අතර 'ය්' ආගමය වේ

බාලා + ඬෙ = බාලා + ඒ
= බාලා + අ + ඒ ('අ' ආගමය)
= බාලා + ය් + අ + ඒ ('ය්' ආගමය)
= බාලාය් + ඓ (අ + ඒ = ඓ)
= බාලායෛ (ය් + ඓ = යෛ)

භූමි + ඒ = භූමි + අ + ඒ ('අ' ආගමය)
= භූමි + ඓ (අ + ඒ = ඓ)
= භූම්ය් + ඓ (ඉ = ය්)
= භූමෛ්‍ය (ය් + ඓ = යෛ)

නදී + ඒ = නදී + අ + ඒ ('අ' ආගමය)
= නදී + ඓ (අ + ඒ = ඓ)
= නද්ය් + ඓ (ඊ = ය්)

= තගෛද්‍ය (ය් + ඓ = යෛ)

ධෙනු + එ = ධෙනු + අ + එ ('අ' ආගමය)

= ධෙනු + ඓ (අ + එ = ඓ)

= ධෙන්ව් + ඓ (උ = ව්)

= ධෙනෛව (ව් + ඓ = වෛ)

වධූ + එ = වධූ + අ + එ ('අ' ආගමය)

= වධූ + ඓ (අ + එ = ඓ)

= වධ්ව් + ඓ (ඌ = ව්)

= වධ්වෛ (ව් + ඓ = වෛ)

ඉද ලිඟු 'ඉ' 'උ' අත් නමු ඞිත් වරු ගත්තා කලැ, පුසු ලිඟු නමු මෙන් ද ගනී

භූමි + ඞෙ = භූමය් + = භූමයෙ

ධෙනු + ඞෙ = ධෙනව් + ඒ = ධෙනවේ

එ හෙයින් —

භූමෛය, භූමයෙ, ධෙන්වෛ, ධෙනවෙ යැ යි රූ දෙක බැගින් වේ

සරුවෙකින් පටන් ගත්තා වරුවක් පර කලැ, 'අ' හැර සෙසු සරුවෙකින් කෙළවර වන නිපුස් නමුවට, 'න්' ආගමය වේ.

වාරි + එ = වාරින් + එ = වාරිණෙ

මධු + එ = මධුන් + එ = මධුනෙ

කර්තෘ + එ = කර්තෘන් + එ = කර්තෘණෙ

'වාරිනෙ' යනු 'වාරිණේ' වූයේ කෙසේ ද?
'ඊ' යන්නේ බලයෙන් 'න්' යනු ණ් වීමෙනි.
මේ බලය 'ෂ' 'සෘ' යන දෙකට ද ඇති.

'ඞෙ' යනු සරුවෙකින් පටන් ගත්තා වරුවෙක් ද? එ සේ යැ. එහි නියම වරු රුව 'ඒ' යනු යි. ඒ සරුවෙක් මැ යි. සෙසු තන්හි 'ඞෙ' වෙනස් නො වේ.

පිතෘ + ඞේ = පිතෘ + එ = පිත්‍රෙ
මාතෘ + ඞේ = මාත්‍රෙ
මරුත් + ඞේ = මරුතෙ

භ්‍යාම්

තුන් වැන්නෙහි මෙනි.

භ්‍යස්

මෙය පර කළ 'අ' 'එ' වෙයි.

බාල + භ්‍යස් = බාලෙභ්‍යස් = බාලෙභ්‍යඃ

සෙසු තන්හි වෙනසෙක් නැති.

බාලාභ්‍යඃ, ගිරිභ්‍යඃ, නදීභ්‍යඃ, ගුරුභ්‍යඃ, වධූභ්‍යඃ, පිතෘභ්‍යඃ, මරුද්භ්‍යඃ, යොෂිද්භ්‍යඃ.

සිවු වන බෙදු අරුත

ලක් (ලක්‍ෂ්‍ය) අරුත යි.

බාලාය = බාලයාට
බාලාභ්‍යාම් = දෙ බාලයනට
බාලෙභ්‍යඃ = බාලයනට

සොළොස් ගැට-පදය

ධීමතාං කාලඃ කාව්‍යශාස්ත්‍රවිනොදෙන ගච්ඡති.
මූර්ඛාණාං ච (කාලඃ) ව්‍යසනෙන (වා) නිද්‍රයා (වා) කලහෙන වා (ගච්ඡති.)

මේ ය∙ පිළිවෙළ.

ධීමත් — නුවණවත්. ධීමතාං — නුවණවතුන් ගේ.

කාව්‍යශාස්ත්‍රවිනොද — කව් සෙවීමේ විනොදුව. කාව්‍ය ස්වෙනය කිරීමේ විශනාදය (ප්‍රීතිය.) ....විනොදෙන — ප්‍රීතියෙන්.

මූර්ඛ — මෝඩයා. මූර්ඛාණාං — මෝඩයන් ගේ.

ව්‍යසන — වැසන. දූ කෙළි, රා පීම් ඈ වැසන නමි.

ව්‍යසනෙන වා — වැසනයෙන් හෝ.

නිද්‍රා — නින්ද. නිද්‍රයා — නින්දෙන්.

කලහ — ඩබරය.

උගනිමු තවත් සොලොවක්:—

පාදපානාං භයං වාතඃ
පද්මානාං ශිශිරො භයම්
පර්වතානාං භයං වජ්‍රඃ
සාධූනාං දුර්ජනො භයම්.

තගමු හෙළුවට :—

පා-පොවුවන් ගේ බිය යි වාතේ.
පියුමන් ඇල් කල බිය යි.
බිය යි විදුර පව්වන් ගේ.
සුදනන් දුදනා බිය යි.

පාදප — ගස. පාදයෙන් බොනුයේ පාදප. පාපොවු. ගසේ පාද නම් මුල් යැ. ගස පොළෝ රසය බොන්නේ පාදයෙන්.

ශිශිර — ඇල් කල. හිම කල. එ කලැ පියුම් වැනැසේ.

වජ්‍ර — හෙණ.

සාධු — සත්පුරුෂයා.

පාලිය

රුකුල

සකු	පාලි
ඉන්ද්‍ර	ඉන්ද
ඊශ්වර	ඉස්සර
ඓශ්වර්‍ය	ඉස්සරිය

ලඞ්කා + ඉන්ද = ලඞ්කින්ද

මේ යැ පාළියට හුරු සකුයෙහි නම් එක් වරැ මැ ගුණාදෙශය වෙයි.

ගුණාදෙශය නම් :—

අ + ඉ ආ + ඉ අ + ඊ ආ + ඊ	යන යුවළකට 'එ' අදෙස් වීම යි.
අ + උ ආ + උ අ + ඌ ආ + ඌ	යන යුවළකට 'ඔ' අදෙස් වීම යි.

ලඞ්කා + ඉන්ද්‍ර = ලඞ්කෙන්ද්‍ර
ගඞ්ගා + ඌර්මි = ගඞ්ගෝර්මි

පාළියෙහි ද කලාතුරෙකින් ගුණාදෙශය ලැබේ.

ඇබෑසිය

1. මෙ තෙක් උගත් සතර වරු පාළියෙහි යෙදෙන අයුරු දක්වන්නැ.
2. එක් එක අකුරින් කෙළවර වන පාළි නමුව බැගින් ගෙනැ සතර වර නගන්නැ.
3. සකු හත් වැන්න පාළියට හුරු කරන්නැ.
4. සිලෝ දෙක මැ පාළියට හරවන්නැ.

---

12. පැදුම

ඇබෑසිය

1. ඞ, ඬ, ශ යන මෙය සකු අකුරින් ලියන්නැ.
2. එ හැම පිලි ගන්වන්නැ.
3. ලියන්නැ සකු අකුරින් මේ තැනුත් :—
ඞ්ඞ, ණ්ඩ, ඬු, ඞ්ක, ඞ්ඛ, ඞ්ග, ඞ්ඝ, ශශ, ශ්‍ය, ශ්‍ර, ශ්ල, ශ්ව, ශ්ම.

4. මේ වදනුත් සකු අකුරින් ලියන්නා. මැද්ද හල් අකුරු බැඳි සේ සලකන්නා.

ඩමරඃ	(බෙරය)	උඩුපඃ	(සඳ)
ඩමරුඃ	(බෙරය)	උඩ්ඩීන	(පියා හැඹීම)
ඩයනම්	(පියා හැඹීම)	අණ්ඩම්	(බිජුව)
ඩිණ්ඩිමඃ	(බෙරය)	ලඞ්කා	
ඩිම්බඃ	(කුඩා දරුවා)	ශඞ්ඛඃ	(හක)
ඩිම්භඃ	(මෝඩයා)	ගඞ්ගා	(ගඟ)
ඩිම්භා	(බිළිඳු දූරිය)	සඞ්ඝඃ	(සමූහය)
ඩුණ්ඩුභඃ	(සපා—සපීයා)	භඞ්ගී	(බිඳුම්)
ඛඞ්ගඃ	(කඩුව)	අඞ්ඝ්‍රිඃ	(පාදය)
ෂඞ්ජඃ	(වැයුමෙහි 'ස' සරුව)	ශ්ලොකඃ	(සිලොව)
		ශ්‍රවණම්	(කන)
නිශ්ශොභ	(ශොභා නැති)	අශ්වඃ	(අසා)
ශ්‍යාම	(අඳුරු පැහැ ඇති)	ශ්මශානම්	(සොහොන)

5. 1 වැනි 2 වැනි 3 වැනි 4 වැනි 5 වැනි වරු රූ පාණිනීන් දැක්වූ සැටියට සඳහන් කරන්නා. නියම රූ කවරේ ද?

6. ඒ රූ එක එක තමූ වගට යෙදෙන සැටි පැහැදුව මැනැවි.

7. මේ තැන් සඳහන්නා, වූ සැටිත් පහදන්නා.

ප්‍රාණ + අනනඃ, මාන + ආභරණඃ, බාලා + අස්ති,
සභා + ආසනම්, මම + ඉච්ඡා, මම + ඊශ්වරඃ,
උමා + ඉන්ද්‍රඃ, උමා + ඊශ්වරඃ, සූර්‍ය + උදයඃ,
වෘත්ත + ඌරුඃ, ගඞ්ගා + උදකම්, රම්භා + ඌරුඃ,
මම + එකඃ, බාලා + එෂා, මම + ඓශ්වර්‍යම්,
ලඞ්කා + ඓශ්වර්‍යම්, බිම්බ + ඔෂ්ඨඃ, සන්ධ්‍යා + ඔෂධීඃ,
මම + ඖදාර්‍යම්, කාන්තා + ඖදාර්‍යම්.

8. පෙරළන්නැ හෙළුවට :—

ගුණී ගුණං වෙත්ති න වෙත්ති නිර්ගුණො
බලී බලං වෙත්ති න වෙත්ති නිර්බලඃ
පිකො වසන්තස්‍ය ගුණං න වායසඃ
කරී ච සිංහස්‍ය බලං න මූෂකඃ

9. මිතු එන සිලොව ද හෙළුවට පෙරළන්නැ.

10. සිලෝ දෙක මැ සකු අකුරින් ලියන්නැ.
('ස' යන්න හෙළු අකුරින් මැ යෙදුව මැනැවි.)

විසයුරුව

වරු රූ

1.	සු	ඖ	ජස්
2.	අම්	ඖට්	ශස්
3.	ටා	භ්‍යාම්	භිස්
4.	ඞේ	භ්‍යාම්	භ්‍යස්
5.	ඞසි	භ්‍යාම්	භ්‍යස්

ඞසි

මෙහි 'ඞ්' යනු ද ඉත් යැ. 'ඉ' යනු ද ඉත් යැ.
නියම වර 'අස්' යනු යි.

'අ' යන්නෙන් පර 'ඞසි' 'අත්' වෙයි.
බාල + ඞසි = බාල + අත් = බාලාත් (අ + අ = ආ)

'ඞසි' පර කලැ නිපුස් නොවන 'ඉ' 'ඒ' වෙයි,
'උ' 'ඕ' වෙයි.

'ඒ' යන්නෙන් හෝ 'ඕ' යන්නෙන් හෝ පර 'අ' ලොප් වෙයි.

කපි + ඞසි = කපි + අස්
= කපේ + අස් (ඉ = ඒ)
= කපේස් ('අ' ලොප්)
= කපේඃ (ස් = ඃ)

ගුරු + ඔසි = ගුරු + අස්
= ගුරෝ + අස් (උ = ඕ)
= ගුරෝස් ('අ' ලොප්)
= ගුරෝඃ (ස් = ඃ)

මෙද ලිඟු ආ — ඉ — ඊ — උ — ඌ — නමුවලට ඔසි වරු පර කලැ වන දූ සලකන්නැ.

බාලා + ඔසි = බාලා + අස්
= බාලා + අ + අස් ('අ' ආගමය)
= බාලා + ය් + අ + අස් ('ය්' ,,)
= බාලාය් + ආස් (අ + අ = ආ)
= බාලායාස් (ය් + ආ = යා)
= බාලායාඃ (ස් = ඃ)

භූමි + ඔසි = භූමි + අස්
= භූමි + අ + අස් ('අ' ආගමය)
= භූමි + ආස් (අ + අ = ආ)
= භූමිය් + ආස් (ඉ = ය්)
= භූම්‍යාස් (ය් + ආ = යා)
= භූම්‍යාඃ (ස් = ඃ)

නදී + ඔසි = නදී + අස්
= නදී + අ + අස් ('අ' ආගමය)
= නදී + ආස් (අ + අ = ආ)
= නද්ය් + ආස් (ඊ = ය්)
= නද්‍යාස් (ය් + ආ = යා)
= නද්‍යාඃ (ස් = ඃ)

ධෙනු + ඔසි = ධෙනු + අස්
= ධෙනු + අ + අස් ('අ' අගමය)
= ධෙනු + ආස් (අ + අ = ආ)
= ධෙන්වාස් (ව් + ආ = වා)
= ධෙන්‍වාඃ (ස් = ඃ)

වධූ + ඞසි = වධූ + අස්
= වධූ + අ + අස් ('අ' ආගමය)
= වධූ + ආස් (අ + අ = ආ)
= වධ්ව් + ආස් (ඌ = ව්)
= වධ්වාස් (ව් + ආ = වා)
= වධ්වාඃ (ස් = ඃ)

ළඳ ලිඟු ඉ — උ — නමු, 'ඞිත්' වරැ, පුම ලිඟු නමු මෙන් ද ගන්නා බව මතක තැබී තොංකරන්නැ.

4.	භූම්‍යෛ	හෝ	භූමයෙ
5.	භූම්‍යාඃ	,,	භූමෙඃ
4.	ධේන්වෛ	,,	ධේනවෙ
5.	ධේන්වාඃ	,,	ධේනොඃ

පුසු ළඳ ලිඟු 'ඍ' නමුයෙහි 'ඞසි' 'උස්' වෙයි, 'උස්' පර කලැ 'ඍ' ලොප් වේ.

පිතෘ + ඞසි = පිතෘ + උස්
= පිත් + උස්
= පිතුස්
= පිතුඃ

'මාතුඃ' යනාදිය ද මෙ සේ මැ යි.

සෙසු තන්හි (ඞසි) 'අස්' යනු නොවෙනස් වැ සිටී.

මරුතඃ, යොෂිතඃ, ජගතඃ

'භ්‍යාම්' 'භ්‍යස්' දෙක පෙර සේ මැ යි.

පස් වැනි බෙදු අරුත

බාලාත් = බාලයා කෙරෙන්
බාලාභ්‍යාම් = දෙ බාලයන් ,,
බාලෙභ්‍යඃ = බාලයන් ,,

වනාත්	=	වනයෙන්
වනාභ්‍යාම්	=	දෙ වනයෙන්
වනෙභ්‍යඃ	=	වනයෙන්, වනවලින්

සොළොස් ගැට-පදය

ගුණී — ගුණවත් තෙමේ. ගුණ ඇතියේ ගුණින්. පළමු වන එක් හිණී වර ගෙනැ 'ගුණී' වෙයි.

චෙත්ති — දනී.

නිර්ගුණො — (නිර්ගුණඃ. ඝොස'කුර පර කලැ 'අඃ' 'ඕ' වෙයි.) ගුණ නැත්තේ.

බලී — බලවත් තෙමේ. බල ඇතියේ බලින්.

පිකො — (පිකඃ) කොවුලා. 'චෙත්ති' යැ යි කියවුව යොදු-ගන්නැ.

වසන්තස්‍ය — වසන්ත කාලයා ගේ. වසන්තෙහි.

වායසඃ — කවුඩා.

න — 'චෙත්ති' යැ යි සබඳ කරන්නැ.

කරී — ඇත් තෙමේ. කර (අත) ඇතියේ කරින්. 'චෙත්ති' යන්න වටහා-ගන්නැ.

සිංහස්‍ය — සිංහයා ගේ.

මූෂකඃ — මීයා

න — 'චෙත්ති' යැ යි සබඳ කරන්නැ.

මේ සොලොව ද උගන්නැ

රූපං ජරා සර්වසුඛානි තෘෂ්ණා
බලෙෂු සෙවා පුරුෂාභිමානම්
යාච්ඤා ගුරුත්වං ගුණමාත්මපූජා
චින්තා බලං හන්ත්‍යදයා ච ලක්ෂ්මීම්.

සර්වසුඛානි — සියලු සුව.

තෘෂ්ණා — ලොබ.

බලෙඤ — දුදනන් කෙරෙහි. බල = දුදන

සෙවා — සෙවනය. ඇසුර.

පුරුෂාභිමානම් — පුරිස් අබිමන. මම පිරිමියෙක්මි යි යන උසස් හැඟුම

යාචඤා — ඉල්ලීම.

ගුරුත්වං — ගුරු බව හරසර.

ආත්මපූජා — තමන් මැ තමන් පුදා-ගැන්ම. තමන් මැ තමන් වනා-ගැන්ම.

චින්තා — සිතිවිල්ල. කො තෙකුත් සිතසිතා පසු වීම

හන්ත්‍යදයා — හන්ති + අදයා.

හන්ති — නසයි.

අදයා — දයාව නැති බව.

ලක්ෂ්මීම් — සිරි. සෝබාව.

මෙහි යෙදුණේ 'හන්ති' යන එක මැ කියවුව යි. ඉතිරිය යුග ගණනෙකින් යුතු යැ. එක් එක් යුගයෙහි එකෙක් කියැවිය යි, අනෙක විඳුව යි. 'හන්ති' යනු මැ කියවුව යි. කියැවිය එකනින් පලමු වන වර ගෙනැ සිටී. පවසන්නැ අරුත.

පාළිය

ඇබෑසිය

1. මෙ නෙක් උගත් වරු රූ පස් ගණය පාළියෙහි යෙදෙන අයුරු දක්වන්නැ.
2. එක එක අකුරින් කෙළවර වන පාළි තමුව බැගින් පස් වරු ගණ ගන්වන්නැ.
3. සිලෝ දෙක මැ හරවන්නැ පාළියට.

රුකුල

පාළි වර නැගිල්ලක් සපයා-ගත්තා. යම් කිසිවක් ඔබට නොසඳහන් වූ විටැ බලනු පිණිසැ යැ, වනපොත් කරනු පිණිසැ නො වේ.

	සකු	පාළි
	වෙත්ති	වේදති
	නිර්ගුණ	නිග්ගුණ
	නිර්බල	නිබ්බල
	සිංහස්‍ය	සීහස්ස
	මූෂක	මූසික
	භූම්‍යෙ	භූමියා
	නද්‍යෙ	නදියා, නජ්ජා
	ධෙන්වෙ	ධෙනුයා
	වධ්වෙ	වධුයා
(5)	කපේඃ	කපිම්හා — ...ස්මා
(5)	ගුරෝඃ	ගුරුම්හා — ...ස්මා
(5)	බාලායාඃ	බාලාය
(5)	භූම්‍යාඃ	භූමියා
(5)	නද්‍යාඃ	නදියා, නජ්ජා
(5)	ධෙන්වාඃ	ධෙනුයා
(5)	වධ්වාඃ	වධුයා
(5)	පිතුඃ	පිතුම්හා — ...ස්මා
(5)	මාතුඃ	මාතුයා
	—භ්‍යඃ	— හි, — භ
	තෘෂ්ණා	තණ්හා
	පුරුෂ	පුරිස
	යාච්ඤා	යාචනා
	ගුරුත්ව	ගුරුත්ත
	ආත්ම	අත්ත
	ලක්ෂ්මී	ලක්ඛී

13. පැදුම

ඇබෑසිය

1. ඉ, ඊ, ඣ, හ යන මෙය සකු අකුරින් ලියන්නැ.

2. ඣ, හ දෙක පිළි ගන්වන්නැ.

3. ජ්ඣ, ඤ්ඣ, හ්ණ, හ්න, හ්ම, හ්‍ය, හ්‍ර, හ්ල, හ්ව යන තැනුත් සකු අකුරින් ලියන්නැ.

(මැදු හල් අකුරු බැඳි සේ සලකන්නැ.)

4. මේ වදනුත් ලියන්නැ සකු අකුරින් :—

ඉන්ද්‍රඃ	(සකා)	හූන	('හූන' ජාතිය)
ඊශ්වරඃ	(ඉසුරා)	හෘදයම්	(ළය)
ඉච්ඡා	(කැමැත්ත)	හේතුඃ	(කාරණය)
ඊශානඃ	(ඉසුරා)	හෛම	(රනින් කළ)
ඣඞ්කාරඃ	(බිගු නද)	හෝරා	(හෝරාව)
ඣඤ්ඣා	(සැඩ සුළඟ)	හෞ	(ඔහෝ)
ඣටිති	(වහා)	හ්‍රස්ව	(ලුහු)
ඣල්ලරී	(බෙරය)	මධ්‍යාහ්නඃ	(මැදි දවල)
උජ්ඣිත	(හරනා ලද)	පරාහ්ණඃ	(පස් වරුව)
හයඃ	(අසා – අශ්වයා)	ජිහ්වා	(දිව)
හානිඃ	(විපත)	සහ්‍ය	(ඉවැසියැ හැකි)
අහිඃ	(නයා)	ආහ්ලාදඃ	(සතුට)
හීන	(පහත්)	බ්‍රහ්මා	(බඹ)
බහු	(බොහෝ)	ජිහ්ම	(ඇද)

5. 1, 2, 3, 4, 5, 6 වැනි වරැ රූ පාණිනීන් කියූ සැටියට දක්වා, එක-එකින් ගත යුතු නියම වරැ රූ වෙන් කරන්නැ.

6. එක් එක් වගෙහි නමුවට මේ වරු රූ යෙදෙන සැටිත් පහදන්නැ.

7. මේ තැන් සඳහන්නැ :—

හස්ති + අලඞ්කාරඃ, මුනි + ආශ්‍රමඃ,
කපි + ඉන්‍ද්‍රඃ, ගිරි + ඊශ්වරඃ,
අති + උග්‍රම්, කවි + ඌහඃ,
මුනි + ඍෂභඃ, ඉති + එවම්,
එති + ඓලඃ, කාන්ති + ඔඝඃ,
අග්නි + ඖෂධම්, ශ්‍රී + අපත්‍රපා,
නදී + ආශ්‍රමඃ, ශ්‍රී + ඉන්‍ද්‍රඃ,
දෙවී + ඊශඃ, දෙවී + උපගතා,
නදී + ඌර්මිඃ, දෙවී + ඍණම්,
නදී + එෂා, මහී + ඓරාවණඃ,
නදී + ඔඝඃ, දෙවී + ඖදාසීම්.

8. පෙරළන්නැ හෙළුවට :—

සම්පූර්ණකුම්භො න කරොති ශබ්ද-
මඬො ඝටො ඝොෂමුපෛති නූනම්.
විද්වාන් කුලීනො න කරොති ගර්වං,
ගුණෛර්විහීනා බහු ජල්පයන්ති.

9. ලියන්නැ සොලොව සකු අකුරින්.

වියයුරුව

වරු

1.	සු	ඖ	ජස්
2.	අම්	ඖට්	ශස්
3.	ටා	භ්‍යාම්	භිස්
4.	ඞෙ	භ්‍යාම්	භ්‍යස්
5.	ඞසි	භ්‍යාම්	භ්‍යස්
6.	ඞස්	ඔස්	ආම්

ඞස්

මෙහි ද 'ඞ්' යනු ඉත් යැ. ඉතිරි වනුයේ 'අස්' යනු පමණෙකි. එ හෙයින් 'ඞසි' වරෙහි ද 'ඞස්' වරෙහි ද කාරය එක යැ. එ පමණ මැ ද? 'ජස්' 'ශස්' දෙ වරෙහි ද කාරය එ මැ යි.

'අ' නමුයේ 'ඞස්' යනු 'ස්‍ය' වෙයි.

බාල + ඞස් = බාල + අස්
= බාලස්‍ය (අස් = ස්‍ය)

වන + ඞස් = වන + අස්
= වනස්‍ය (අස් = ස්‍ය)

සෙසු නමුවලට 'ඞස්' වර යෙදෙනුයේ 'ඞසි' වර යෙදෙන්නා සේ මැ යැ.

බාලා + ඞසි	=	බාලායාඃ
ගිරි + ,,	=	ගිරේඃ
භූමි + ,,	=	භූමේඃ, භූම්‍යාඃ
ගුරු + ,,	=	ගුරෝඃ
ධෙනු + ,,	=	ධෙනොඃ, ධෙන්වාඃ
වධූ + ,,	=	වධ්වාඃ
පිතෘ + ,,	=	පිතුඃ
මාතෘ + ,,	=	මාතුඃ

ඔස්

අ – ආ – නමුවකට මෙය යෙදෙන කලැ මැද 'ය්' ආගමය වේ, 'ආ' ලුහු වේ.

බාල + ඔස් = බාල + ය් + ඔස් ('ය්' ආගමය)
= බාලයෝස් (ය් + ඔ = යෝ)
= බාලයෝඃ (ස් = ඃ)

බාලා + ඔස් = බාලා + ය් + ඔස් ('ය්' ආගමය)
= බාලායෝස් (ය් + ඔ = යෝ)
= බාලයෝස් ('ආ' ලුහුව)
= බාලයෝඃ (ස් = ඃ)

සෙසු තන්හි වෙනසෙක් නැති

කපි + ඕස් = කප්‍යෝඃ (ඉ = ය්)
ගුරු + ඕස් = ගුර්වෝඃ (උ = ව්)
භූමි + ඕස් = භූම්‍යෝඃ (ඉ = ය්)
ධෙනු + ඕස් = ධෙන්වෝඃ (උ = ව්)
නදී + ඕස් = නද්‍යෝඃ (ඊ = ය්)
වධූ + ඕස් = වධ්වෝඃ (ඌ = ව්)
පිතෘ + ඕස් = පිත්‍රෝඃ (ඍ = ර්)
මාතෘ + ඕස් = මාත්‍රෝඃ (ඍ = ර්)

ඉ, උ, ඍ නිපුස් නමුවට 'න්' ආගමය වන බව ඔබ දනිති.

ශුචි + ඕස් = ශුචිනෝඃ
මධු + ඕස් = මධුනෝඃ
කර්තෘ + ඕස් = කර්තෘණෝඃ

ආම්

පණ'කුරකට පසු වැ මේ 'ආම්' යෙදෙන කලැ, මැද 'න්' ආගමය වේ 'නාම්' පර කලැ පෙර පණ'කුර දිගු වේ.

බාල + ආම් = බාල + න් + ආම් ('න්' ආගමය)
= බාල + නාම් (න් + ආ = නා)
= බාලානාම් ('අ' දිගු වීම)

බාලා + ආම් = බාලා + න් + ආම්
= බාලානාම්

කපි + ආම් = කපි + න් + ආම්
= කපි + නාම්
= කපීනාම්

ගුරූණාම්, පිතෘණාම් යනාදිය ද සිදු වන සේ සලකන්නැ.

මරුත් + ආම් = මරුතාම්

'ත්' ආගමය නො වේ. ඇයි?

ස වැනි වරැ අරුත

බාලස්‍ය — බාලයා ගේ
බාලයොඃ — දෙ බාලයන් ගේ
බාලානාම් — බාලයන් ගේ
වනස්‍ය — වනයා ගේ; වනයේ
වනයොඃ — දෙ වනයන් ගේ; දෙ වනයේ
වනානාම් — වනයන් ගේ; වනයේ; වනවලැ

සැදෑහුම් (සන්ධි)

අ, ඉ, උ, ඍ, ඏ යන මේ හුදු පණ හඩ යි.

හඩ දෙකක් මුසු වැ නුවූ හෙයින් හුදු යැ.

එ, ඓ, ඔ, ඖ යන මේ මුසු පණ හඩ යි.

අ	+	ඉ	=	එ
අ	+	එ	=	ඓ
අ	+	උ	=	ඔ
අ	+	ඔ	=	ඖ

එ සතර මුසු වැ නිපදනා සැටි යැ මේ.

එක් වගෙහි හුදු පණ හඩ දෙකක් එක්තැන් වූ කලැ, දෙකට මැ ඒ වගෙහි එක් දිගුවෙක් වේ.

අ	+	අ	=	ආ
අ	+	ආ	=	ආ
ආ	+	අ	=	ආ
ආ	+	ආ	=	ආ

සෙස්ස ද මෙ බඳු යැ

ඉ	+	ඉ	=	ඊ
උ	+	උ	=	ඌ
ඍ	+	ඍ	=	ඎ

'ඏ' යන්නෙහි දිගුවක් නැතී යෙති.

ඉ, උ, ඍ, ඏ යන සතර, පණ හඩක් පර කලැ ක්‍රමයෙන් ය්, ව්, ර්, ල් බවට පැමිණේ දිගු වුව ද මේ වෙයි.

අති + උත්තමම් = අත්‍යුත්තමම් (ඉ = ය්)

ලඝු + අක්‍ෂරම් = ලඝ්වක්‍ෂරම් (උ = ව්)
පිතෘ + ආසනම් = පිත්‍රාසනම් (ඍ = ර්)
ඏ + ආකාරඃ = ලාකාරඃ (ඏ = ල්)

සොලෝ ගැම-පදය

සම්පූර්ණඃ, කුම්භඃ (කළය,) ශබ්දං න කරොති; අර්ධඃ (අඩක් පිරුණු,) ඝටඃ (කුම්භඃ,) නූනං (ඒකාන්තයෙන්,) ඝොෂං (ඝොසට,) උපෛති (පැමිණේ.) විද්වාන් (උගත්,) කුලීනඃ (කුලවත් තෙමේ,) ගර්වං (උඩඟු බව,) න කරෝති; ගුණෛඃ (ගුණයන් විසින්,) විහීනාඃ (ඉතා හීන වූවාහු,) බහු (බොහෝ කොටැ,) ජල්පයන්ති (දෙඩත්.)

පාලිය

ඇබෑසිය

1. මෙ තෙක් උගත් සං-වරූ පාලියෙහි යෙදෙන අයුරූ දක්වන්නූ.
2. එක එක අකුරින් කෙළවර වන පාලි නමුව බැගින් සං-වරූ ගන්වන්නූ.
3. සිලොව පාලියට නඟන්නූ.

රූකුල

සකු	පාලි
ශබ්ද	සද්ද
අර්ධ	අඩ්ඪ
උපෛති	උපෙති
විද්වාන්	විඤ්ඤූ
ගර්ව	ගබ්බ
ගුණෛඃ	ගුණෙහි
ජල්ප	ජප්ප
(6) කපෙඃ	කපිතො, කපිස්ස
(6) ගුරොඃ	ගුරුතො, ගුරුස්ස
(6) පිතුඃ	පිතු, පිතුතො, පිතුස්ස
පිතෘෘණාම්	පිතූනං
(6) මාතුඃ	මාතුයා
මාතෘෘණාම්	මාතූනං

14. පැදුම්

ඇබෑසිය

1. ඍ ඎ යන දෙක සකු අකුරින් ලියන්නැ.
2. ඔබ කැමැති නොපණ'කුරක් ගෙනැ සියලු පිලි ගන්වන්නැ.
3. මෙ වදන් සකුයෙන් ලියන්නැ:—

    ඍතුඃ (උතුව)
    ඍක්ෂඃ (වලසා)
    ඍග්වෙදඃ (ඍග් වේදය)
    ඍජු (නොවක්)
    ඍණම් (ණය)
    ඍද්ධිඃ (ඉදුහය)
    ඍෂභඃ (ගොනා)
    ඍෂිඃ (ඉසියා)

4. සත් වරැ රැ පාණිනීන් කී සැටියට දක්වන්නැ.
5. අ, ආ, ඉ, ඊ, උ, ඌ, ඍ තමූ එක එක ලිඟුයෙහි වර නැඟෙන සැටි සඳහන් කළ මැනැවි.
6. සඳහා (සන්ධි කොටැ) තියර දක්වන්නැ:—

    මධු + අත්‍ර, භානු + ආතපඃ,
    සාධු + ඉදම්, ධෙනු + ඊක්ෂණම්,
    භානු + උදයඃ, චාරු + ඌරුඃ,
    ලඝු + ඍකාරඃ, ගුරු + ඎකාරඃ,
    සාධු + එතත්, ඍතු + ඓරාවණඃ,
    මධු + ඔඝඃ, භානු + ඖදසීම්,
    වධූ + අජිනම්, වධූ + ආසනම්,
    චමූ + ඉන්ද්‍රඃ, වධූ + ඊක්ෂණම්,
    ශ්වශ්‍රූ + උක්තිඃ, වධූ + ඌරුඃ,
    වධූ + ඍජ්වී,
    වධූ + එකා, ශ්වශ්‍රූ + ඓශ්වර්යම්,
    වධූ + ඔෂ්ඨඃ, චමූ + ඖදසීම්.

7. පෙරලන්නැ හෙළුවට:—

අස්ති ග්‍රීවං ශිරෝ නාස්ති
ද්වෞ භුජෞ කරවර්ජිතෞ
ශීතාහරණසාමථ්‍යෝ
න රාමො න ච රාවණඃ

8. සොලොව ලියන්නැ සකු අකුරින්.

වියසුරුව

	එක්.	දෙ.	බුහු.
1.	සු	ඖ	ජස්
2.	අම්	ඖට්	ශස්
3.	ටා	භ්‍යාම්	භිස්
4.	ඞෙ	,,	භ්‍යස්
5.	ඞසි	,,	,,
6	ඞස්	ඕස්	ආම්
7.	ඞි	,,	සුප්

මේ යැ වරු ගණ සත.

ඞි

මෙහි ද ‘ඞ්’ යනු ඉත් යැ. නියම වරු රුව ‘ඉ’ යනු යි. ‘අ’ නමුයේ (‘ඞි’) ‘ඉ’ වෙනස් නො වේ.

බාල + ඞි = බාල + ඉ
= බාලේ (අ + ඉ = එ)

සකුයෙහි ‘අ + ඉ’ දෙක ‘එ’ වෙයි.

‘ඉ’ ‘උ’ නමුවලැ ‘ඞි’ වරුවට ‘ඖ’ යනු මාරු වේ. මේ ‘ඖ’ පර කලැ පෙර පණ‘කුර ලොප් වේ.

කපි + ඞි = කපි + ඉ
= කපි + ඖ (ඞි = ඖ)
= කප් + ඖ (‘ඉ’ ලොප්)
= කපෞ (ප් + ඖ = පෞ)

ගුරු + ඞි = ගුරු + ඉ
= ගුරු + ඖ (ඞි = ඖ)
= ගුර් + ඖ (‘උ’ ලොප්)
= ගුරෞ (ර් + ඖ = රෞ)

'ස්මිං' පර කලැ පුසු, ලද 'ඍ' 'අර්' වෙයි.

පිතෘ + ස්මිං = පිතෘ + ඉ
= පිතර් + ඉ (ඍ = අර්)
= පිතරි (ර් + ඉ = රි)

මාතෘ + ස්මිං = මාතෘ + ඉ
= මාතර් + ඉ
= මාතරි

'ඍ' හැරැ අන් පණ'කුරෙකින් කෙළවර වන ලද නමුවෙකැ 'ස්මිං' 'ආම්' වෙයි.

'ආ' යන්නට පර වැ මේ 'ආම්' වන කලැ මැදැ 'ය්' ආගමය යි.

බාලා + ස්මිං = බාලා + ඉ
= බාලා + ආම් (ස්මිං = ආම්)
= බාලා + ය් + ආම් ('ය්' ආගමය)
= බාලායාම් (ය් + ආ = යා)

භූමි + ස්මිං = භූමි + ඉ
= භූමි + ආම්
= භූමිය් + ආම් (ඉ = ය්)
= භූමියාම් (ය් + ආ = යා)

නදී + ස්මිං = නදී + ඉ
= නදී + ආම්
= නද්ය් + ආම් (ඊ = ය්)
= නද්‍යාම් (ය් + ආ = යා)

ධෙනු + ස්මිං = ධෙනු + ඉ
= ධෙනු + ආම්
= ධෙන්ව් + ආම් (උ = ව්)
= ධෙන්වාම් (ව් + ආ = වා)

වධූ + ස්මිං = වධූ + ඉ
= වධූ + ආම්
= වධ්ව් + ආම් (ඌ = ව්)
= වධ්වාම් (ව් + ආ = වා)

'ස්මිං' පර කලැ පුං, ලිඟු 'ඍ' 'අර්' වෙයි.

පිතෘ + ස්මිං = පිතෘ + ඉ
= පිතර් + ඉ (ඍ = අර්)
= පිතරි (ර් + ඉ = රි)

මාතෘ + ස්මිං = මාතෘ + ඉ
= මාතර් + ඉ
= මාතරි

'ඍ' හැර අන් පණ'කුරෙකින් කෙළවර වන ලද නමුවෙකැ 'ස්මිං' 'ආං' වෙයි.

'ආ' යන්නට පර වැ මෙ 'ආං' වන කලැ මැදැ 'ය්' ආගමය යි.

බාලා + ස්මිං = බාලා + ඉ
= බාලා + ආං (ස්මිං = ආං)
= බාලා + ය් + ආං ('ය්' ආගමය)
= බාලායාං (ය් + ආ = යා)

භූමි + ස්මිං = භූමි + ඉ
= භූමි + ආං
= භූමිය් + ආං (ඉ = ය්)
= භූමියාං (ය් + ආ = යා)

නදී + ස්මිං = නදී + ඉ
= නදී + ආං
= නද්‍ය් + ආං (ඊ = ය්)
= නද්‍යාං (ය් + ආ = යා)

ධෙනු + ස්මිං = ධෙනු + ඉ
= ධෙනු + ආං
= ධෙන්ව් + ආං (උ = ව්)
= ධෙන්වාං (ව් + ආ = වා)

වධූ + ස්මිං = වධූ + ඉ
= වධූ + ආං
= වධ්ව් + ආං (ඌ = ව්)
= වධ්වාං (ව් + ආ = වා)

'ඉ' 'උ' ලද නමු, පුසු නමු මෙන් ද ඕත් වර ගන්නා බව මතක තැබි තොකරත්නැ.

හූමි + ඕ = හූම්‍යාම් හෝ හූමෞ

ධෙනු + ඕ = ධෙන්වාම් ,, ධෙනෞ

'අ' යනු හැර සෙසු පණ'කුරෙකින් කෙළවර වන නිපුස් නමුවත් පණ'කුරැ වරත් අතර 'න්' ආගමය වන බව ද මතක තැබි නො කැරේ වා.

ශුචි + ඕ = ශුචි + ඉ
= ශුචින් + ඉ
= ශුචිනි

මධු + ඕ = මධු + ඉ
= මධුන් + ඉ
= මධුනි

කතෘ + ඕ = කතෘ + ඉ
= කතෘන් + ඉ
= කතෘණි

හල'ත් නමුවට නිකම මැ 'ඉ' යෙදේ.

මරුත් + ඕ = මරුත් + ඉ
= මරුති

යොෂිත් + ඕ = යොෂිත් + ඉ
= යොෂිති

ජගත් + ඕ = ජගත් + ඉ
= ජගති.

ඹිස්

ස වැන්තෙහි මෙනි.

සුප්

මෙහි 'ප්' යන්න ඉත් යැ. නියම වර 'සු' යනු යි. 'සු' යෙදෙන කලැ නමුයේ 'අ' යන්න 'ඒ' වෙයි.

බාල + සුප් = බාල + සු
= බාලේ + සු (අ = ඒ)
= බාලේෂු (සු = ෂු)

'අ' 'ආ' දෙක හැර සෙසු පණ'කුරකට පසු වූ 'සු' වර 'ෂු' වෙයි.

බාලා + සුප් = බාලාසු
කපි + සුප් = කපිසු = කපිෂු
ගුරු + සුප් = ගුරුසු = ගුරුෂු
නදී + සුප් = නදීසු = නදීෂු
වධූ + සුප් = වධූසු = වධූෂු
පිතෘ + සුප් = පිතෘසු = පිතෘෂු
මරුත් + සුප් = මරුත්සු

සත් වැනි වරැ අරුත

බාලෙ = බාලයා කෙරෙහි
බාලයොඃ = දෙ බාලයන් ,,
බාලෙෂු = බාලයන් ,,
වනෙ = වනයෙහි
වනයොඃ = දෙ වනයෙහි
වනෙෂු = වනයෙහි; වනවලැ

සැදෑහුම

උ = උ
උ = ඌ
ඌ = උ
ඌ = ඌ
} = ඌ

වෙන පණ'කුරක් පර කලැ 'උ' හෝ 'ඌ' හෝ 'ව්' වෙයි.

සිලෝ ගැට-පදය

ග්‍රීවා (බෙල්ල) අස්ති (ඇති.) ශිරඃ (හිස) න අස්ති (නැති.) ද්වෞ භුජෞ (දෙ බාහුහු) කරවර්ජිතෞ (අතුල් නැත්තාහු යැ.) ශීතාභරණසාම්‍යඃ (ශීතාභරණයෙහි සමත් බව ඇත්-තේ යැ.) රාමඃ න (රාමයා නො වේ.) රාවණඃ ච න.

මෙ තේරැවිල්ලෙකි. තෝරන්නැ.

'ශීතාභරණසාම්‍යඃ' යන්නට අරුත් තුනක් දියැ හැකි යැ. 'ශීතා + ආභරණ + සාම්‍යඃ' යැ යි ගත් කලැ

'ශීතාව ගෙනැ ඒමෙහි සමත් බව ඇත්තේ යැ' යන අරුත ලැබේ. ඒ සමත් බව ඇත්තේ රාමයා යැ. රාවණයා පැහැරැ-ගෙනැ ආ ශීතාව රාමයා නැවැතැ ගෙනැ ගියේ යැ.

'සීතා' යනු යැ රම් බිරිය ගේ නම. ඇතැම් තන්හි 'ශීතා' යනු ද යෙදුණු බව පෙනේ.

'ශීතා + හරණ + සාමර්ථ්‍යඃ' යැ යි ගත් කලැ 'ශීතාව පැහැරැ-ගෙනැ යාමේ සමත් බව ඇත්තේ' යනු අරුත යි. රාවණයා යැ.

'ශීත + ආභරණ + සාමර්ථ්‍යඃ' යැ යි ගත, 'ශීතය (ශීතල භාවය) දුරු කිරීමේ සමත් බව ඇත්තේ යැ' යන අරුත යෙදෙයි. 'රාම' 'රාවණ' යන අරුත් නොයෙදෙන බව කියැවිණ. කිමෙක් ද?

තවත් එ බඳු මැ තේරැවිල්ලෙකි:—

අසටි නාසති ශිරො නාසති
බාහූ සතඃ තෙඃ නිරඞ්ගුලී
නාසති පාදද්වයං ගාඪ-
මඞ්ගමාලිඞ්ගති සවයම්.

අසටි (ඇටයෙක්,) න අස්තිං ශිරඃ න අසති. බාහූ සතඃ (දෙ බාහුවෙක් වෙයි.) තෙඃ නිරඞ්ගුලී (එ දෙක ඇඟිලි රහිත යැ.) පාද-ද්වයං න අසති. සවයං (තෙමේ,) අඞ්ගං (ඇඟ,) ගාඪම් (තද කොටැ,) ආලිඞ්ගති (වැලැඳැ-ගනී)
කියන්නැ කිමෙක් දැයි.

පාළිය

ඇබෑසිය

1. සත් වරැ රැ පාළියෙහි යෙදෙන සැටි දක්වන්නැ.
2. එක එක අකුරින් කෙළවර වන නමුව බැගින් පාළියට වර නගන්නැ.
3. සිලෝ දෙක පාළියට නගන්නැ.

රූකුල

සකු	පාළි
බාලායාම්	බාලායං, බාලාය
කපෞ	කපිම්හි, කපිස්මිං
ගුරෞ	ගුරුම්හි, ගුරුස්මිං
භූමෞ, භූම්‍යාම්	භූමියං, භූමියා
ධෙනෞ, ධෙන්වාම්	ධෙනුයං, ධෙනුයා
නද්‍යාම්	නදියං, නදියා
ශුචිනි	සුචිනි, සුචිම්හි, සුචිස්මිං
බාලෙෂු	බාලෙසු
කපිෂු	කපිසු, කපීසු
ගුරුෂු	ගුරුසු, ගුරූසු
පිතෘෂු	පිතූසු, පිතරෙසු
මාතෘෂු	මාතූසු, මාතරෙසු
ග්‍රීවා	ගීවා
ශිරඃ	සිරො
ද්වෞ	ද්වෙ, දුවෙ
භුජෞ	භුජා
සාමර්ථ්‍ය	සාමත්ථිය
අස්ථි	අට්ඨි
ස්වයම්	සයං

---

15. පැදුම

ඇබෑසිය

1. සකුයෙහි ලිවීමට ඉතා පහසු අකුරත් ඉතා අමාරු අකුරත් පවසන්න.
2. මූදුන් ඉරින් පුරා නොවැසෙන අකුරු කවරේ ද?
3. පා පිල්ල වෙනස් ලෙසකට යෙදෙන්නේ කවර අකුරු හා ද?
4. සියලු සක් වරු රූ ගෙන, ඉන් අකුරු හැර, සෙස්ස සරු වරු යැ, සිටු වරු යැ යන දෙ ගොඩට බෙදන්න.

5. ඇමැතුමෙහි යෙදෙනුයේ කවර වරු ද?

6. නගන්නැ සකුවට:—

පුතේ	දෙ පුතුනි	පුතුනි
ළඳේ	දෙ ළඳුනි	ළඳුනි
හරිය	දෙ හරියෙනි	හරියෙනි
බිම	දෙ බිමෙනි	බිමෙනි
නදිය	දෙ නදියෙනි	නදියෙනි
ගුරු	දෙ ගුරුනි	ගුරුනි
වධුව	දෙ වධුවෙනි	වධුවෙනි
පියේ	දෙ පියෙනි	පියෙනි
මව	දෙ මවුනි	මවුනි
වනය	දෙ වනයෙනි	වනයෙනි
වාරිය (දිය)	දෙ වාරියෙනි	වාරියෙනි
මධුව	දෙ මධුවෙනි	මධුවෙනි

7. ගළපා නියර දක්වන්නැ:—

පිතෘ + ආඥතම්, ඍ + ආකාරඃ,
මාතෘ + ඍණම්, තෲ + අණ,
ග්‍රාමෙ + එඩකඃ, නෙ + අන,
පො + අන, නෛ + අක, පෞ + අක.

8. පෙරළන්නැ හෙළුවට:—

පුස්තකස්ථා ච යා විද්‍යා පරහස්තෙ ච යද්ධනම්
කාර්යකාලෙ සමාසන්නෙ න සා විද්‍යා න තද්ධනම්

9. ලියන්නැ සොළොව සකු අකුරින්.

ඇමැතුම

සකුයෙහි ඇමැතුම සඳහා ද යෙදෙනුයේ පළමු වන වරු මැ යි. වෙනසෙක් නම්, එක් ගිණි වර ලොප් වීම යි. ඇතැම් තන්හි තව ද සුළු වෙනස් කම් ඇති වේ.

සුර + සුප් = සුර (වර ලොප් වීම යි.)

ඖ, ජස් දෙ වර පෙරැ සේ මැ යි.

(සරන හෙයින් — දිගට පවත්නා හෙයින් — පණ හඩ ගරු නම් යැ. සිටුනා හෙයින් — දිගට නො පැවැතැ නවත්නා හෙයින් — නොපණ හඩ සිටු නම් යැ.)

1.	ස්	ඖ	අස්
2.	අම්	,,	,,
3	ආ	භ්‍යාම්	භිස්
4.	ඒ	,,	භ්‍යස්
5.	අස්	,,	,,
6.	,,	ඕස්	ආම්
7.	ඉ	,,	සු

සරු වරු, සිටු වරු දෙ ගොඩට වෙන් කරන්නැ.

සෑදෑනුම

සරුවක් පර කලැ,

'ඍ' 'ර්' වෙයි — පිතෘ + උත්තම = පිත්‍රුත්තම
'ඏ' 'ල්' වෙයි — ඏ + අනුබන්ධඃ = ලනුබන්ධඃ
'එ' 'අය්' වෙයි — හෙ + අ = හය
'ඕ' 'අව්' වෙයි — හො + අ = හව
'ඓ' 'ආය්' ,, — හෛ + අ = හාය
'ඖ' 'ආව්' ,, — හෞ + අ = හාව

'පිතෘ + ඍණම්' යන තන්හි 'ඍ' 'ර්' නො වේ. ඇයි? දෙක එක් වගෙහි සරු යැ. එ හෙයින් දෙක එක් වැ එක් දිගුවෙක් වේ. පිතෲණම්.

'ගෘහෙ + එකඃ' යන තන්හි 'ඒ' + 'ඒ' එකතු වැ එක් දිගු සරුවක් වැ 'ගෘහෙකඃ' යැ යි නො සෑදෑහේ ද? නො වේ. 'ඒ' යනු එක් සරුවක් නොවන හෙයිනි. 'එ' යනු 'අ + ඉ' යන දෙක යැ. එ හෙයින් ගෘහෙ + 'එකඃ' යනු 'ගෘහ් අ + ඉ අ + ඉ කඃ' යන්නට සම යැ. එක් වගෙහි සරු දෙකෙක් එක් වැ නැති. 'එ' 'අය්' වෙයි. ගෘහය් + එකඃ = ගෘහයෙකඃ

'ඕ' යනු 'අ + උ' දෙක යැ. එ හෙයින් 'ඔ + ඔ' එක් වුව ද එක් දිගුවෙක් නො වේ.

සිලෝ ගැට-පදය

පුස්තකස්ථා (පොතෙහි සිටි) යා විද්‍යා (යම් දැනුමෙක් — ශාස්ත්‍රයෙක් ද, පරහස්තෙ (අනුන් අතැති) යත් ධනං ච (යම් දනයෙක් ද,) කාර්‍යකාලෙ සමාසාතෙ (කටයුත්තට කල් පැමිණි සඳැ) සා විද්‍යාන (ඒ දැනුමෙක් නො වේ,) තත් ධනං න (ඒ දනයෙක් නො වේ.)

දැනුම දැනුමක් වනුයේ කවර විටැ ද? දනය දනයක් වනුයේ කවර විටැ ද?

උගනිමු තව ද සිලොවක්:—

> කිම්ෂටමන්නං බරසූකරාණාං
> කිං රතනාභාරො මෘගපක්ෂිණාං ච
> අන්ධස්‍ය දීපො බධිරස්‍ය ගීතං
> මූර්ඛස්‍ය කිං ශාස්ත්‍රකථාප්‍රසඞ්ගඃ

තගමු හෙළුවට:—

ගදුබුවනට හූරනට කිම රස	අහර
මුවනට සියොතුනට කිම මහරු මිණි	හර
අදහුට පහන බිහිරා හට ගී	දහර
දදහුට කිම සතර මහ දෙඩුම	මනහර

කිම් ඉෂ්ටම් අන්නම් = කිම්ෂ්ටමන්නං; බර — ගදුබුවා; සූකර — හූරා; රතනාභාර — රුවන් හර; මිණි මාලය; දීප — පහන; බධිර — බිහිරා; ශාස්ත්‍රකථාප්‍රසඞ්ග — සතර (ශාස්ත්‍ර) පිළිබඳ කතායෙහි යෙදීම.

සොලොවේ අරුත ඔබ ගේ බසින් ලියුව මැනැවි.

පාළිය

ඇබෑසිය

1. ඇමැතුම පාළියෙහි යෙදෙන සැටි පවසන්නැ.
2. සතු හ වැන්න පාළියට නගන්නැ.
3. සිලෝ දෙක හරවන්නැ පාළියට.

රූකුල

සකු	පාළි
පුත්‍ර	පුත්ත
කාන්ත	කන්ත
හරේ	හරි
භූමෙ	භූමි
නදි	නදි
ගුරෝ	ගුරු
වධු	වධු
පිතඃ	පිතා, පිත
මාතඃ	මාතා, මාත
වාරි - වාරේ	වාරි
මධු - මධො	මධු
කාර්‍ය	කාරිය
ඉෂ්ට	ඉට්ඨ
රත්න	රතන
මෘග	මිග
පක්ෂින්	පක්ඛි
මූෂ	මූස
ශාස්ත්‍ර	සත්ථ
ප්‍රසඞ්ග	පසඞ්ග